ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

වාර්ෂික වාර්තාව - 2016

පෙළගැස්ම **පිටුව**

1.	අපගේ දැක්ම/ මෙහෙවර	01 - 02
2.	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සභාපතිතුමාගේ පණිවිඩය	03 - 04
3.	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය	05
4.	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම කෙටියෙන් හඳුනා ගනිමු	06
5.	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ විගණන හා කළමනාකරන කමිටුව සහ ප්‍රසම්පාදන කමිටු	07
6.	ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය	08 - 09
7.	මානව සම්පත් විශ්ලේෂණය	10 - 11
8.	සැපයුම්කරුවන් පිළිබඳ විස්තර	12
9.	නිෂ්පාදන තොරතුරු හා අපේක්ෂිත ඉලක්කය	13 - 16
10.	ත්‍රිපෝෂ බෙදාහැරීමේ ක්‍රියාවලිය සහ තොරතුරු	17 - 20
11.	අවසන් ඉලක්කය	21
12.	2016 වර්ෂය තුළ අත් කරගත් ජයග්‍රහණ හා සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා	22
13.	ස්තුතිය	23
14.	වාර්ෂික මූල්‍ය ප්‍රකාශය	24 - 44
15.	විගණකාධිපති වාර්තාව	45 - 59

අපගේ දැක්ම

ශ්‍රී ලාංකේය පොදු ජනතාව

මන්දපෝෂණයෙන් තොර

සෞභාග්‍යමත් අභිමානවත්

නිරෝගීමත් පෝෂිත

ජාතියක් බවට පත් කිරීම

අපගේ මෙහෙවර

ආශ්චර්ය සපිරි හෙට දවස ලෝකය දිනවන
අප මාතෘ භූමියෙහි
සෞභාග්‍යමත්, තෙදවත්, ගුණවත්
ශ්‍රී ලාංකේය ජාතික අනාගතය උදෙසා
රාජ්‍ය භාණ්ඩාගාරයේ අනු දැනුමැතිව
සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය, අධීක්ෂණය
පරිපූර්ණව,
ස්වදේශීය ගොවියා බලසතු කරන
සැපයුම්කාරක බලමුළු සවි ගන්වා
උසස් නියමානුකූල ප්‍රමිති ගුණ පෝෂිත
ත්‍රිපෝෂ අතුරු ආහාරය
මනාව සෞඛ්‍ය ආරක්ෂිතව සාදවා, අසුරා, නිමවා,
සුවගුණ අපේක්ෂිත
ප්‍රතිලාභි ජන හිත සුව පිණිස ම
අඛණ්ඩව සපයා ප්‍රදානය කිරීම ද
සම්භාව්‍ය සේවා අභිමානයෙන් ඇප කැප වූ
මහ ක්‍රියාන්විත මෙහෙයුමකින්
දේශය ද - විශ්වය ද
ජය ගන්නා
යහපත් ත්‍රිපෝෂ පවුලක් වීම ද
විශ්වවීය සෞඛ්‍ය දර්ශක ඉලක්ක සපුරන
සෞඛ්‍ය සම්පන්න ශ්‍රී ලාංකේය ජාතියක පැවැත්ම
පිණිස විශිෂ්ඨ ලෙස කැපවූ ද
පළමු හා එකම දේශීය සමාගම වීම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් හි සභාපතිතුමාගේ පණිවිඩය

පෝෂණයෙන් සපිරි නිරෝගිමත් ජනතාවක් බිහි කිරීමේ ජාතික මෙහෙවර ඉටු කිරීම උදෙසා ත්‍රිපෝෂ අතිරේක ආහාරය නිෂ්පාදනය කොට සෞඛ්‍ය සායන මගින් ශ්‍රී ලංකාවේ වෙසෙන සියළුම ගර්භනී මව්වරුන්, කිරිදෙන මව්වරුන් හා වයස අවුරුදු 05ට අඩු, බර අඩු දරුවන් උදෙසා නොමිලේ බෙදා හැරීම ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ආයතනය විසින් සිදු කරනු ලබන ප්‍රමුඛ ජාතික මෙහෙවරකි.

අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය අමාත්‍යවරයාව සිටියදි එතුමාගේ සංකල්පයක් මත 2010.09.17 දින ත්‍රිපෝෂ වැඩසටහය, පූර්ණ රජය සතු සමාගමක් ලෙස **ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්** නමින් ස්ථාපිත කළ අතර එම අවස්ථාවේදි සමස්ථ ශ්‍රී ලාංකික අවශ්‍යතාවයෙන් සපුරාලිය හැකි වුයේ 60% - 70% ක ප්‍රමාණයකි.

නොමිලේ බෙදා හරිනු ලබන 100% ක ප්‍රතිලාභි අවශ්‍යතාවය සැපිරීමේ අරමුණු සාක්ෂාත් කිරිමට වර්තමාන සෞඛ්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා විසින් අයවැය මගින් මුදල් ලබා දෙන ලදි. මේ හේතුවෙන් නව යන්ත්‍ර පද්ධතිය සවිබල ගැන්වීමේ කටයුතු ආරම්භ කිරිම තුළින් සමස්ත වාර්ෂික අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම නොමිලේ ලබා දිමේ ඉලක්කය ජයගැනිමේ මූලික අඩිතාලම තැබීම අප විසින් මේ වසරේ සිදු වු සුවිශේෂිම සිදු විම බව සතුටින් ප්‍රකාශ කරමි.

එපමණක්ද නොව එම නොමිලයේ ලබා දෙනු ලබන ත්‍රිපෝෂ ප්‍රමාණය ප්‍රතිලාභීන්ට ලබා දිමෙන් පසුව ඇතිවන මෙ:ටො 1,000-1,200 ක පමණ වු අතිරික්ත ත්‍රිපෝෂ ප්‍රමාණය

ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ මග පෙන්වීම මත වෙළඳපලට හඳුන්වා දීමද තව නොබෝ දිනකින් මල්වල ගන්වන්නට අප විසින් සැලසුම් සකස් කර ඇත. ඒ අනුව මේ වන විට සමස්ත ත්‍රිපෝෂ මාසික නිෂ්පාදනය මෙ:ටො 2,700 කි. ඉන් මෙ:ටො 1,800 ක ප්‍රමාණයක් නොමිලේ ලබා දෙනු ලබන අතර මෙ:ටො 1,000 ප්‍රමාණයක අතිරික්තය වෙළඳපල වෙත හඳුන්වා දීමට අපේක්ෂිතය. ගුණාත්මක බවින් ඉතා උසස් මට්ටමක ඇති මෙම අතිරේක පෝෂ්‍යදායි ආහාරය විශේෂයෙන්ම පාසැල් සිසුන්ටත්, වැඩකරන ජනතාවටත් සහනදායි මිලකට මිළදී ගැනිමට හැකි වන හෙයින් ඔවුනට මහත් ප්‍රයෝජනයක් සිදු වනවා ඇත.

මෙම අපහසු ඉලක්කයන් ඉතා කෙටි කාලයක් තුල ජයග්‍රහණය කිරීමට මා දිරිමත් කල අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා, ගරු සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සමස්ත සේවක මණ්ඩලය හා අඛණ්ඩ නිෂ්පාදනයක් උදෙසා නිසිකලට අමුද්‍රව්‍ය සපයන අපගේ සැපයුම්කරුවන් හා අපහට නන් අයුරින් සහය දක්වන සියළු දෙනා කෘතඥ පූර්වකව සිහි කරමි.

එම්. ඩී. බන්දුසේන

සභාපති

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
අධ්‍යක්ෂ මණ්ඩලය - 2016

- සභාපති, එම්. ඩී. බන්දුසේන මහතා

- අධ්‍යක්ෂ, වෛද්‍ය පාලිත ගුණරත්න මහිපාල මහතා
  සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
  අධ්‍යක්ෂිකා පෝෂණ සම්බන්ධීකරණ අංශය
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, ඒ. ආර්. අහමඩ් මහත්මිය
  නීති නිළධාරිණී
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, තේජා හේරත් මහත්මිය
  ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරිණී
  කාර්මික තාක්ෂණ ආයතනය

- අධ්‍යක්ෂිකා, වෛද්‍ය දමයන්ති හපුගොඩ මහත්මිය
  ළමා රෝග විශේෂඥ
  පානදුර මහ රෝහල

- අධ්‍යක්ෂ, චින්තක කුලරත්න මහතා
  අධ්‍යක්ෂ
  ජාතික අයවැය දේපාර්තමේන්තුව

- නිරීක්ෂක, එස්. ආර්. රාජපක්ෂ මහතා
  ප්‍රධාන ගණකාධිකාරී
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- තනූජා ප්‍රියදර්ශනි අල්විස් මහත්මිය
  අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ත්‍රිපෝෂ ආයතනය කෙටියෙන් හඳුනා ගනිමු

- **ලිපිනය** - තැ.පෙ. 17, කොළඹ පාර, කපුවත්ත, ජා-ඇල
- **දුරකථන** - 0112 - 236588
  0112 - 237418
  0112 - 233451
- **ෆැක්ස් අංකය** - 0112 - 237363
- **ඊ-මේල් ලිපිනය** - **thriposha@gmail.com**
- **අමාත්‍යාංශය** - සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
- **ආයතනයේ ස්වභාවය** - සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින පූර්ණ රාජ්‍ය සමාගමකි
- **සමාගම් ලියාපදිංචි අංකය** - PB /3873
- **ප්‍රධාන නිෂ්පාදනය** - පෝෂණ ගුණයෙන් හා සෞඛ්‍යයෙන් පිරිපුන් ත්‍රිපෝෂ අතිරේක ආහාරය
- **බෙදා හැරීමේ මධ්‍යස්ථාන** -
  * දිවයින පුරා ඇති සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථාන
  * වතු
  * පරිවාස හා ළමා රක්ෂණ මධ්‍යස්ථාන
- **බෙදා හරිනු ලබන ආකාරය** - දුම්රිය වැගන් හා ලොරි රථ මගින්
- **ප්‍රතිලාභින්** -
  * සියලු ම ගර්භනි මව්වරුන්
  * කිරිදෙන මව්වරුන්
  * පෝෂණ අවශ්‍යතා සහිත ළමුන්
  * ඇතැම් රෝගීන්
- **මුළු ප්‍රතිලාභින් සංඛ්‍යාව** - දශ ලක්ෂය ඉක්මවා ඇත
- **බැංකුව** - ලංකා බැංකුව
- **විගණක** - විගණකාධිපති
  විගණකාධිපති දෙපාර්තමේන්තුව
  අංක 306/72, පොල්දූව පාර
  බත්තරමුල්ල

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
විගණන හා කළමනාකරණ කමිටුව - 2016

- චින්තක කුලරත්න මහතා
  සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්‍ෂ - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
  සාමාජික - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- ඒ. ආර්. අහමඩ් මහත්මිය
  සාමාජික - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- එස්. ආර්. රාජපක්‍ෂ මහතා
  නිරීක්ෂක - විගණන හා කළමනාකරණ කමිටුව
  ප්‍රධාන ගණකාධිකාරි සෞඛ්‍ය අමාත්‍යාංශය

- නිශාන්ත හේවාගම මහතා
  මූල්‍ය කළමනාකරු
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- එල්. ජේ. එස්. ප්‍රේමචන්ද්‍ර මහතා
  අභ්‍යන්තර විගණක
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව
(රුපියල් මිලියන 60 දක්වා)

- සභාපති
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- ප්‍රධාන ගණකාධිකාරි
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා
  බෝ නොවන රෝග අංශය
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

සුළු ප්‍රසම්පාදන කමිටුව
(රුපියල් මිලියන 10 දක්වා)

- ජ්‍යේෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී (මානව සම්පත් හා නීති)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- කළමනාකරු (තත්ත්ව පාලන)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය

ත්‍රිපෝෂ ආයතනයේ කළමනාකරණ කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයට 1976 වර්ෂයේ දී පැවරුණි. කළමනාකරණ කාර්යයන් සඳහා ටෙන්ඩර් කැඳවන ලද අතර, ඒ සඳහා ලංකා දුම්කොළ සමාගම තෝරා ගනු ලැබී ය. එතැන් සිට 2010 වර්ෂය දක්වාම මෙහි පාලන කටයුතු ලංකා දුම්කොළ සමාගම විසින් සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දායකත්වය වඩාත් ළං කරමින් ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාවේ නඩත්තු වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ කටයුතු 1987 වර්ෂයේ සිට සිදු විය. එමෙන්ම ත්‍රිපෝෂ කර්මාන්තශාලාව සතු භූමි භාගය යන්ත්‍රෝපකරණ හා අනෙකුත් සම්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් විය.

රටේ මන්දපෝෂණය තුරන් කරලීමේ ජාතික වැඩසටහන වඩාත් බලගතු කිරීමේ අරමුණින් ත්‍රිපෝෂ ආයතනය රජයට පවරාගෙන එහි නිෂ්පාදන වැඩි දියුණු කිරීමට රජයේ අවධානය යොමු විය. එවක සිටි සෞඛ්‍ය අමාත්‍ය, වර්තමාන ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු 2010.09.17 දින සිට පූර්ණ රාජ්‍ය සමාගමක් ලෙසින් මෙම ත්‍රිපෝෂ ආයතනය **"ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්"** නමින් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත විය. අංක පී.බී./3873 යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයක් ලෙසින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ නව සමාගම ලියාපදිංචි කරන ලදි. ඉන්පසු 2011.01.07 දින සිට සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත නව කළමනාකරණ මණ්ඩලයක් යටතේ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ කටයුතු ආරම්භ විය.

නිෂ්පාදන ප්‍රගතිය

2011 වර්ෂයේ රජයට පවරා ගන්නා අවස්ථාවේදි ශ්‍රී ලංකාව තුළ ත්‍රිපෝෂ ලැබීමට හිමිකම ඇති සම්පූර්ණ මසක ප්‍රතිලාභීන් සංඛ්‍යාව 928,000ක් වේ. මෙම ප්‍රතිලාභීන්,

- සියලුම ගර්භනී මව්වරුන්
- සියලුම කිරිදෙන මව්වරුන් (ළදරුවාට මාස 06ක් ගත වනතුරු)
- මන්ද පෝෂණයෙන් පෙළෙන මාස 06ට වැඩි ළදරුවන් සහ අවුරුදු 05ට අඩු පෙර පාසල් ළදරුවන්
- බර අනුව ළමා වර්ධක සටහනේ 3වන ශතක රේඛාවට පහළින් සිටින ළමුන්
- ඉහත කාණ්ඩයට අයත් රෝහල්ගත රෝගීන් යන අයගෙන් සමන්විත වේ.

ඉහත කී ත්‍රිපෝෂ ප්‍රතිලාභීන් වෙත සම්පූර්ණයෙන් මසකට අවශ්‍ය ත්‍රිපෝෂ සැපයීමට මසකට ත්‍රිපෝෂ මෙ.ටො. 1,392ක් නිෂ්පාදනය කළ යුතු වේ. 2010 සැප්තැම්බර් මාසය දක්වා ත්‍රිපෝෂ ආයතනය රජයට පවරා ගැනීමට පෙර මසක නිෂ්පාදනය මෙ.ටො. 731ක් විය. 2010 සැප්තැම්බර් මස සමාගම රජයට පවරා ගැනීමත් සමග නිෂ්පාදනයේ විශාල වැඩිවීමක් සිදු විය. නවීන යන්ත්‍රසූත්‍ර ස්ථාපනය හා සේවක දිරි ගැන්වීම් ආදිය මෙම නිෂ්පාදන ඉහළ යාමට හේතු විය. ඒ අනුව යමින් 2016 වර්ෂයේ මුළු නිෂ්පාදනය මෙ.ටො. 9,801ක් දක්වා ඉහළ නැංවීමට හැකි වූ අතර 2016 වර්ෂයේ

පැවති බ්‍රේරේඩ් යන්ත්‍රය ගලවා ඉවත් කර නව ඇන්ඩර්සන් යන්ත්‍රය ස්ථාපිත කිරීම නිසා නිෂ්පාදනයේ යම් අඩුවීමක් සිදුවිය.

2016 වර්ෂයේ මාසික ප්‍රතිලාභී සංඛ්‍යාව මිලියනයක් බවට ගණන් බලා ඇති අතර, ඒ සඳහා මසක නිෂ්පාදන අවශ්‍යතාවය මෙ.ටො. 1,500ක් වනු ඇත. මෙම අවශ්‍යතා සාක්ෂාත් කර අතිරික්තය දේශීය වෙළඳපොළට හඳුන්වාදීම වාර්තමාන ඉලක්කය වේ. මෙය ඉතා පහසු ඉලක්කයක් වනුයේ පහත සඳහන් වැඩපිළිවෙලවල් මේ වන විටත් ක්‍රියාත්මක කර අවසන් බැවිනි.

ඉලක්ක සපුරා ගැනීම සඳහා දියත් කරන ලද ක්‍රියාමාර්ග

01 පැරනි බ්‍රේරේඩ යන්ත්‍රය ගලවා දැනට භාවිතා කරන ඇන්ඩර්සන් යන්ත්‍රය මෙන් දෙගුණයක් ධාරිතාවය ඇති නව ඇන්ඩර්සන් යන්ත්‍රයක් ඇමෙරිකාවෙන් ආනයනය කර දැනටමත් ස්ථාපිත කිරීම හා ඊට සමගාමීව නව මෙගාමිල් යන්ත්‍රයක් හා නව බොයිලේරුවක් ස්ථාපිත කිරීම

02 නව යන්ත්‍ර පද්ධතියට සරිලන පරිදි පැරනි ගොඩනැගිල්ල අළුත් වැඩියා කිරීම

03 නව යන්ත්‍ර පද්ධතිය ක්‍රියා කරවීමට හැකිවන පරිදි නව ට්‍රාන්ස්පෝමරයක් සහ එහි පැනල් පද්ධතිය සඳහා ගොඩනැගිල්ලක් ස්ථාපිත කිරීම

04 අමුද්‍රව්‍ය හා නිමිද්‍රව්‍ය බෑමට, පැටවීමට හා එහා මෙහා ගෙනයාමට පහසු වන පරිදි නව ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම

05 ත්‍රිපෝෂ නිෂ්පාදනය ඉතා කාර්යක්ෂමව, නිවැරදිව සහ ඉතා පහසුවෙන් ඇසුරුම් කිරීමට හැකි වන පරිදි නව ඇසුරුම් යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම

මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවා ගණන, තනතුරු හා අනුමත සේවක සංඛ්‍යාව

01	**ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්**		
	• ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)	01	
	• ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති)	01	02
02	**මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්**		
	• කළමනාකරු (ඉංජිනේරු හා නිෂ්පාදන සේවා)	01	
	• කළමනාකරු (තත්ත්ව පාලන)	02	
	• කළමනාකරු (මුදල්)	01	
	• කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන)	01	05
03	**කනිෂ්ඨ කළමනාකරුවන්**		
	• බෙදාහැරීමේ නිළධාරි	01	
	• අභ්‍යන්තර විගණක නිළධාරි	01	
	• මුදල් නිළධාරි	01	
	• සැපයීම් නිළධාරි	01	
	• ගබඩා නිළධාරි	01	
	• ගුදම් ගබඩා නිළධාරි	01	
	• නිෂ්පාදන නිළධාරි	03	
	• පරිපාලන නිළධාරි	01	
	• ගිණුම් නිළධාරි	01	
	• ඉංජිනේරු සේවා නිළධාරි	01	12
04	**කළමනාකරණ සහකාර (තාක්ෂණ)**		04
05	**කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)**		18
06	**ප්‍රාථමික සේවා**		
	ප්‍රාථමික සේවා (ශිල්පීය)		
	• රියදුරු	07	
	• විදුලි කාර්මික	04	11
	ප්‍රාථමික සේවා (අර්ධ ශිල්පීය)		
	• බොයිලේරුකරුවන්	03	
	• පිටර්වරුන්	03	
	• ලේත් යන්ත්‍රකරුවන්	02	
	• යන්ත්‍ර ක්‍රියාකරු	28	
	• තත්ත්ව පරීක්ෂක	07	
	• ගිනි නිවීමේ උපස්ථායක	01	
	• ෆෝක්ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු	02	46
	ප්‍රාථමික සේවා (ශිල්පීය නොවන)		
	• උද්‍යානකරු	02	
	• කම්කරු/කාර්යාල සහායක	02	
	• සාමාන්‍ය කම්කරු	129	
	• කම්කරු පාලිකා	01	134
එකතුව			**232**

අපගේ කණ්ඩායම සේවා අනුව විහිදී ඇති ආකාරය මෙසේය

- **නිෂ්පාදනාගාරය**

(කණ්ඩායමට ඇතුළත් පිරිස 205)

	<u>තනතුරු</u>	**<u>සංඛ්‍යාව</u>**
01	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)	01
02	කළමනාකරු (ඉංජිනේරු සේවා හා නිෂ්පාදන)	01
03	කළමනාකරු (තත්ත්ව ආරක්ෂක)	02
04	ගුදම් ගබඩා නිළධාරී	01
05	නිෂ්පාදන නිළධාරීන්	03
06	ගබඩා නිළධාරීන්	01
07	බෙදාහැරීමේ නිළධාරීන්	01
08	ඉංජිනේරු සේවා නිළධාරී	01
09	කළමනාකරණ සහාකාරවරුන්	14
10	විදුලි කාර්මිකයින්	04
11	ගිනි නිවීමේ උපස්ථායකයින්	01
12	ෆෝක්ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු	02
13	තත්ත්ව පරීක්ෂකයින්	07
14	යන්ත්‍ර ක්‍රියාකරුවන්	28
15	ලේත් යන්ත්‍රකරුවන්	02
16	පිටර්වරුන්	03
17	බොයිලේරුකරුවන්	03
18	සාමාන්‍ය කම්කරුවන්	<u>130</u>
එකතුව		**<u>205</u>**

- **පරිපාලන, ගිණුම් හා වෙනත් අංශ**

(කණ්ඩායමට ඇතුළත් පිරිස 27)

	<u>තනතුරු</u>	**<u>සංඛ්‍යාව</u>**
01	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති)	01
02	කළමනාකරු (මූල්‍ය)	01
03	කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන)	01
04	මුදල් නිළධාරී	01
05	ගිණුම් නිළධාරී	01
06	අභ්‍යන්තර විගණන නිළධාරී	01
07	පරිපාලන නිළධාරී	01
08	සැපයුම් නිළධාරී	01
09	කළමනාකරණ සහාකාරවරුන්	08
10	රියදුරන්	07
11	කාර්යාල සහායක	02
12	උද්‍යානකරු	<u>02</u>
එකතුව		**<u>27</u>**

2016 වර්ෂයේ සැපයුම්කරුවන් පිළිබඳ විස්තර

සෝයා බෝංචි හා බඩඉරිඟු

1. **ගොවි මධ්‍යස්ථානය**
   මිගලෑව
   නො: 367
   03 මහළ ඩැම් වීදිය
   කොළඹ 12

2. **එස්. ඩී. කේ. යුනයිටඩ් ඇග්‍රිවෙන්චස් (ප්‍රයිවට්) ලිමිටඩ්**
   පන්ඩුලගම
   අනුරාධපුර

3. **ඒකාබද්ධ ගොවි සංවිධානය**
   අම්පාර
   නො: 169, දුටු ගැමුණු මාවත
   පෑලියගොඩ

4. **කේ. එස්. ටී. එවර්ග්‍රීන් (ප්‍රයිවට්) ලිමිටඩ්**
   නො: 583
   සාන්ත ජුඩ් මාවත
   රිලවුල්ල
   කඳාන

5. **එස්. බී. එම්. ලංකා ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්**
   නො : 184/1
   වේල්ල වීදිය
   කොළඹ 12

01. **කිරි පිටි**
    මිල්කෝ සමාගම
    නො: 45
    නාවල පාර
    නාරාහේන්පිට

02. **විටමින් සහ මිනරල්**

    ජේ.කේ. ට්‍රේඩ්ලින්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්
    නො: 44
    තලවතුගොඩ පාර
    පිටකෝට්ටේ

03. **ක්‍රාෆ්ට් පෙපර්**
    අබ්දුල්ලා ඉන්ඩස්ට්‍රීස් පැකේජින් (ප්‍රයිවට්) ලිමිටඩ්
    නො: 72
    මහ විද්‍යාල මාවත
    කොළඹ 13

04. **පොලිතින්**
    නිව් ජීවා ඉන්ඩස්ට්‍රී (ප්‍රයිවට්) ලිමිටඩ්
    පොල්වත්ත
    කුන්ඩසාලේ
    මහනුවර

2012 වසරේ සිට 2016 වසර දක්වා ත්‍රිපෝෂ නිෂ්පාදනය (මාස්ටර් බැග්ස්)

මාසය	2012	2013	2014	2015	2016
ජනවාරි	37,689	43,026	40,316	47,901	57,542
පෙබරවාරි	47,414	44,109	47,708	43,679	53,416
මාර්තු	47,198	44,701	56,917	53,206	55,410
අප්‍රේල්	30,336	22,018	38,492	42,176	44,501
මැයි	43,425	30,069	56,456	57,367	52,757
ජුනි	45,936	33,370	51,654	53,393	15,757
ජුලි	45,736	60,285	57,309	61,000	-
අගෝස්තු	47,236	55,429	57,677	57,719	3,060
සැප්තැම්බර්	44,645	58,712	57,621	60,182	38,071
ඔක්තෝබර්	48,009	49,958	58,522	62,381	38,806
නොවැම්බර්	15,308	42,348	56,324	60,908	47,392
දෙසැම්බර්	37,520	18,238	42,072	48,633	28,898
මාස්ටර් බැග්ස්	**490,452**	**502,263**	**621,068**	**648,545**	**435,610**
මෙට්‍රික් ටොන්	**11,035**	**11,300**	**13,974**	**14,592**	**9,801**

2012 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බැග්ස්)



2013 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බෑග්ස්)



2014 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බෑග්ස්)



2015 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බෑග්ස්)



2016 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බෑග්ස්)



2016 වර්ෂයේ ත්‍රිපෝෂ නිෂ්පාදනය මාස්ටර් බෑග් 435,610 දක්වා අඩුවීමට ප්‍රධාන හේතුව වසර 40 ක් පැරණි යන්ත්‍ර වෙනුවට ඇමරිකාවෙන් ආනයනය කරන ලද නව ඇන්ඩර්සන් යන්ත්‍ර පද්ධතිය සවි කොට ස්ථාපිත කිරීමය.

2017 අපේක්ෂිත ඉලක්කය

- නොමිලේ ලබා දෙනු ලබන ත්‍රිපෝෂ සියලුම ප්‍රතිලාභීන්ට ලබාදීමේ 100% ඉලක්කය ජයගැනීම.
- නව යන්ත්‍ර සූත්‍ර සවි කිරීමෙන් කරන ලද අතිරික්ත නිෂ්පාදනය නව මුහුණුවරකින් වෙළඳපලට හඳුන්වා දි වෙළඳපල ජයගැනීම 2017 වර්ෂයේ අපගේ ඉලක්කය වේ.

- මීට සමගාමීව ත්‍රිපෝෂ පරිශ්‍රය තුල නව වෙළඳ කුටියක් ස්ථාපිත කර නව නිෂ්පාදනය අලෙවි කිරීම.

- නව ලොරි රථයක් මිලදී ගෙන බෙදා හැරීම ඉතා කාර්යක්ෂමව සිදු කිරීම

2017 වර්ෂයේ ත්‍රිපෝෂ නිෂ්පාදනය පහත අයුරින් ඉහළ නැංවීම ආයතනයේ ඒකායන අපේක්ෂාවයි.

මාසය	**2017**	
	මාස්ටර් බෑග්ස්	**පැකට්(ග්‍රෑම් 750)**
ජනවාරි	82,797	2,483,910
පෙබරවාරි	73,464	2,203,920
මාර්තු	87,915	2,637,450
අප්‍රේල්	74,066	2,221,980
මැයි	79,184	2,375,520
ජුනි	84,905	2,547,150
ජුලි	93,636	2,809,080
අගෝස්තු	84,302	2,529,060
සැප්තැම්බර්	84,905	2,547,150
ඔක්තෝබර්	85,808	2,574,240
නොවැම්බර්	86,410	2,592,300
දෙසැම්බර්	82,797	2,483,910
එකතුව	**1,000,189**	**30,005,670**

දත්ත හා තොරතුරු

ත්‍රිපෝෂ නිෂ්පාදනය, බෙදාහැරීම හා අලෙවිය පිළිබඳ දත්ත ක්ෂණිකව හා පහසුවෙන් ලබාගත හැකි පරිදි මෘදුකාංග (Software) පද්ධතියක් ස්ථාපිත කිරීම.

නිෂ්පාදන අමුද්‍රව්‍ය තව තවත් මිල දි ගැනීම

දේශීය ගොවියා තව තවත් සුරක්ෂිත කිරීමේ අරමුණ පෙරදැරිව ඔවුන්ගේ නිෂ්පාදන ගොවි සංවිධාන වෙතින් ත්‍රිපෝෂ ආයතනයට සපයා ගැනීම

ත්‍රිපෝෂ බෙදා හැරීමේ ක්‍රියාවලිය

ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාව (ජා-ඇල)

බෙදාහැරීමේ කටයුතු කිරීම (ලොරි රථ මගින් හා දුම්රිය වැගන් මගින්)

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

වතු

ළමා මධ්‍යස්ථාන

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

සෞඛ්‍ය මධ්‍යස්ථාන (සායන)

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය

ත්‍රිපෝෂ ප්‍රතිලාභින්

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මගින් ත්‍රිපෝෂ නිෂ්පාදනය සිදු කර සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ක්‍රමානුකූලව බෙදාහැරීම් කටයුතු සිදු කරනු ලැබේ.

ත්‍රිපෝෂ බෙදාහැරීමේ මධ්‍යස්ථාන

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ

1. මධ්‍යම පළාත
2. නැගෙනහිර පළාත
3. උතුරු මැද පළාත
4. වයඹ පළාත
5. උතුරු පළාත
6. සබරගමුව පළාත
7. දකුණු පළාත
8. ඌව පළාත
9. බස්නාහිර පළාත

වතු අධිකාරි

1. හැටන්
2. මාතලේ
3. කෑගල්ල
4. මහනුවර
5. කළුතර
6. නුවර එළිය
7. මාතර
8. බදුල්ල
9. ගාල්ල
10. රත්නපුර

වෙනත්

1. හමුදා රෝහල්
2. පොලිස් රෝහල්
3. ළදරු පාසල්
4. නගර සභා
   - මීගමුව
   - කොළඹ
   - මාතලේ
   - ගාල්ල
   - නුවර

පරිවාස හා ළමා ආරක්ෂණ අධිකාරි

1. අනුරාධපුරය
2. බත්තරමුල්ල
3. බදුල්ල
4. ගාල්ල
5. යාපනය
6. ත්‍රිකුණාමලය
7. කුරුණෑගල
8. රත්නපුර
9. කෑගල්ල
10. නුවර

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ

1. අම්පාර
2. අනුරාධපුරය
3. බදුල්ල
4. මඩකලපුව
5. කොළඹ
6. ගාල්ල
7. ගම්පහ
8. හම්බන්තොට
9. යාපනය
10. කල්මුණේ
11. කළුතර
12. රත්නපුර
13. ත්‍රිකුණාමලය
14. මහනුවර
15. කෑගල්ල
16. කිලිනොච්චිය
17. කුරුණෑගල
18. මාතලේ
19. මාතර
20. මන්නාරම
21. මොණරාගල
22. නුවර එළිය
23. පොළොන්නරුව
24. පුත්තලම
25. වව්නියාව

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ ගනන

1. අම්පාර	07	10. කල්මුණේ	13	19. මාතර	16
2. අනුරාධපුරය	18	11. කළුතර	13	20. මන්නාරම	03
3. බදුල්ල	15	12. රත්නපුර	17	21. මොණරාගල	11
4. මඩකලපුව	13	13. ත්‍රිකුණාමලය	10	22. නුවර එළිය	11
5. කොළඹ	11	14. මහනුවර	21	23. පොළොන්නරුව	07
6. ගාල්ල	19	15. කෑගල්ල	11	24. පුත්තලම	11
7. ගම්පහ	16	16. කිලිනොච්චිය	04	25. වව්නියාව	04
8. හම්බන්තොට	12	17. කුරුණෑගල	23		
9. යාපනය	11	18. මාතලේ	12		

2016 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදා හැරීමේ තොරතුරු

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ	ප්‍රතිලාභින් සංඛ්‍යාව	මසකට වෙන් කරනු ලබන ප්‍රමාණය (මෙ.ට)		
		මව්වරුන්ට	ළමයින්ට	එකතුව
අම්පාර	26,508	589	1,177	1,766
අනුරාධපුරය	56,142	1,250	2,492	3,742
බදුල්ල	38,654	851	1,727	2,578
මඩකලපුව	44,820	1,363	1,625	2,988
කොළඹ රෝහල	4,848	68	256	324
කොළඹ නගර සභාව	8,731	198	386	584
කොළඹ (දකුණ)	43,243	962	1,919	2,881
ගාල්ල	47,290	1,043	2,109	3,152
ගම්පහ	56,010	2,260	1,475	3,735
හම්බන්තොට	34,758	836	1,670	2,506
යාපනය	33,062	735	1,468	2,203
කල්මුණේ	34,585	759	1,547	2,306
කළුතර	36,715	1,039	1,409	2,448
මහනුවර	61,913	1,369	2,757	4,126
කෑගල්ල	29,681	659	1,320	1,979
කිලිනොච්චිය	7,987	176	355	531
කුරුණෑගල	70,435	1,560	3,137	4,697
මන්නාරම	10,224	226	455	681
මාතලේ	31,715	687	1,431	2,118
මාතර	51,240	1,139	2,278	3,417
මොණරාගල	28,509	641	1,259	1,900
නුවරඑළිය	26,057	564	1,173	1,737
පොළොන්නරුව	33,500	652	1,580	2,232
පුත්තලම	27,857	661	1,197	1,858
රත්නපුර	45,377	1,010	2,017	3,027
ත්‍රිකුණාමලය	28,266	630	1,255	1,885
වව්නියාව	8,101	180	360	540
මුලතිව්	6,825	153	302	455
එකතුව	**933,053**	**22,260**	**40,136**	**62,396**

පරිවාස ළමා රක්ෂණ මධ්‍යස්ථාන	ප්‍රතිලාභින් සංඛ්‍යාව	මසකට වෙන් කරනු ලබන ප්‍රමාණය (මෙ.ට)
09	22,692	6,051
එකතුව	**22,692**	**6,051**

වතු ප්‍රදේශ	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මසකට වෙන් කරනු ලබන ප්‍රමාණය (මළු)		
		මව්වරුන්ට	ළමයින්ට	එකතුව
හැටන්	10,565	679	1,427	2,106
මාතලේ	2,888	178	400	578
කෑගල්ල	4,347	253	616	869
මහනුවර	5,324	331	734	1,065
කළුතර	2,539	163	345	508
නුවර එළිය	11,500	749	1,551	2,300
මාතර	1,077	70	145	215
බදුල්ල	10,685	716	1,421	2,137
ගාල්ල	1,095	69	150	219
රත්නපුර	4,743	310	638	948
එකතුව	**54,763**	**3,518**	**7,427**	**10,945**

2016 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදාහැරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව හා ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව

	මධ්‍යස්ථාන සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාස 28 වෙනුවෙන්	740	933,053
වතු	447	54,763
පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුවේ ළමා නිවාස	09	22,692
එකතුව	**1,196**	**1,010,508**

අවසන් ඉලක්කය

රජයට බරක් නොවන රජය මත යැපෙන ආයතනයක් නොවී ස්වාධීනව උපයාගත් ආදායම මත යැපෙන රාජ්‍ය ආයතනයක් වීම අපගේ අවසන් ඉලක්කය වේ.

2016 වර්ෂය තුළ අත්කරගත් ජයග්‍රහණ සහ සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා

2016 වසරේ අප ලද ඉහලම ජයග්‍රහන

2016 වර්ෂයේ අප ලද අතිමහත් ජයග්‍රහණය වනුයේ වසර 40 කට ආසන්න කාලයක් භාවිත කරන ලද පැරණි යන්ත්‍ර වෙනුවට නව යන්ත්‍රයක් ඇමරිකාවෙන් ආනයනය කොට සවි කරවා 2016/12/05 වන දින අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ සුරතින් විවෘත කිරීමත් ඊට සමගාමීව නව බොයිලේරුව විවෘත කිරීමත්ය.

මේ තුලින් මෙතෙක් පැවති නිෂ්පාදනය දෙගුණ වීම අපේක්ෂිත අතර අතිරික්තය වෙළඳපලට හඳුන්වා දීම මිළඟ ඉලක්කය වේ.

2017 වර්ෂයේ සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා

1. ක්‍රමවත් බෙදාහැරීමේ ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීමේ පහසුව තකා අප ආයතනයට ලොරි රථයක් මිලදී ගැනීම.

2. අතිරික්ත නිෂ්පාදනය නව මුහුණුවරකින් වෙළඳපලට හඳුන්වාදී වෙළඳපල ජයගැනීම.

3. අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් මගින් නව නිෂ්පාදනය පාරිභෝගිකයින් අතර ප්‍රචලිත කිරීම.

4. නව නිෂ්පාදනය පාරිභෝගිකයාට පහසුවෙන් මිලදී ගතහැකි වන පරිදි ආයතන පරිශ්‍රය තුල නව අලෙවි සැලක් ස්ථාපිත කිරීම.

5. නව නිෂ්පාදනයත් සමග අවශ්‍ය කරන ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම

ස්තුතිය

අප දිරිමත් කරමින් නිරතුරු අපට මාර්ගෝපදේශකත්වය ලබා දුන් සෞඛ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාට, අපට නිරතුරු අවශ්‍ය සහය ලබා දුන් නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍ය ගරු ෆයිසල් කසීම් මැතිතුමාට, අප නිසි මගට යොමු කරමින් උපදෙස් ලබා දුන් සෞඛ්‍ය ලේකම් ගරු අනුර ජයවික්‍රම මැතිතුමාට සහ අපට වාර්ෂිකව අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් අතහිත දුන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ගරු ආර්. එච්. එස්. සමරතුංග මැතිතුමාට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

එලෙසින්ම ආයතනයේ කළමනාකාරීත්වය දරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම මහත්ම, මහත්මීන්ගෙන් ලද සහාය අප සැමට ආශිර්වාදයක්ම විය. එමෙන්ම අපගේ සැපයුම්කරුවන් හා බාහිරව අපට සේවය සලසන සැම කෘතඥ පූර්වකව සිහිපත් කරමු.

අපගේ ආයතනයේ ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් ගලා යන ධූරාවලින් තෘප්තිමත්ව සේවය කරන කාර්ය මණ්ඩලයක් දක්නට ලැබීම මහත් සතුටකි. ආයතනයේ දියුණුවට ඔවුන් ලබා දෙන දායකත්වය අගය කළ යුතුය. අවසන් වශයෙන් මෙම ඉලක්ක ජය ගැනිමට නිරතුරු වෙහෙසෙන ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි සමස්ත කාර්ය මණ්ඩලයට සමස්ත ජයග්‍රහණයේ ප්‍රණාමය පුදකර සිටිමු.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

ආදායම් හා වියදම් ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	31/12/2016 රු. ශත.	31/12/2015 රු.
<u>ආදායම</u>			
වර්ෂය තුළ වියදම් ප්‍රතිපූර්ණය කිරීම	02	1,469,302,572.89	1,776,421,903
අඩු කළා : නිෂ්පාදන පිරිවැය	03	(1,392,865,137.52)	(1,793,195,367)
		76,437,435.37	(16,773,464)
වෙනත් ආදායම්	04	19,710,672.50	25,779,714
		96,148,107.87	9,006,250
අඩු කළා : පිරිවැය			
බෙදාහැරීමේ පිරිවැය	05	6,929,064.13	11,119,781
පරිපාලන වියදම්	06	42,509,552.45	36,103,901
මූල්‍ය සහ වෙනත් වියදම්	07	225,860.02	3,272,031
		49,664,476.60	50,495,714
වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම		46,483,631.27	(41,489,464)

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 6 සිට 21 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශ සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය කියවනු ලැබිය යුතුය.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2016 දෙසැම්බර් 31 දිනට

	සටහන්	31/12/2016 රු. ශත.	31/12/2015 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ	10	**667,194,699.22**	435,918,034
අස්පෘශ්‍ය වත්කම්	11	**495,890.68**	661,188
		667,690,589.90	436,579,222
ආයෝජන	12	**92,641,169.64**	90,251,731
ජංගම වත්කම්			
වට්ටෝරු භාණ්ඩ	13	**206,108,078.60**	228,273,118
වෙළඳ සහ වෙනත් ලැබීම්	14	**75,520,500.60**	134,547,131
මුදල් හා මුදල් සමාන දෑ	15	**12,310,647.40**	53,922,992
		293,939,226.60	416,743,241
මුළු වත්කම්		**1,054,270,986.14**	943,574,193
කොටස් හිමිකම් හා බැරකම්			
ප්‍රාග්ධනය හා සංචිත			
ප්‍රාග්ධන සංචිත	17	**380,421,185.24**	307,575,084
ප්‍රත්‍යාගණන සංචිත	18	**307,170,027.56**	307,170,028
වියදම ඉක්මවූ සමුච්චිත ආදායම		**307,683,544.60**	261,223,489
මුළු කොටස් හිමිකම්		**995,274,757.40**	875,968,600
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	19	**37,858,775.50**	29,593,685
වෛද්‍යාධාර අරමුදල	20	**238,678.90**	241,490
		38,097,454.40	29,835,175
ජංගම බැරකම්			
වෙළඳ සහ වෙනත් ගෙවීම්	21	**20,898,774.34**	37,770,418
මුළු කොටස් හිමිකම් හා බැරකම්		**1,054,270,986.14**	943,574,193
		-	-

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 6 සිට 21 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය කියවනු ලැබිය යුතුය.

මෙම මූල්‍ය ප්‍රකාශ, 2007 අංක 07 දරන සමාගම් පනතේ දක්වා ඇති නියමයන්ට අනුකූලව සකස් කරනු ලැබ ඇත.

....
මූල්‍ය ප්‍රධානි

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දැරිය යුතු වන්නේය.

මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කර, අත්සන් තබන ලදී.

....
සභාපති අධ්‍යක්ෂ

ජා ඇල, කපුවත්ත
දිනය : 2017.06.26

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
කොටස් හිමිකම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	වියදම ඉක්මවූ සමුච්චිත ආදායම	එකතුව
		රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
2015.01.01 දිනට ශේෂය		136,873,127.47	307,170,027.56	302,676,082.86	**746,719,237.89**
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	15	197,517,198.54	-	-	**197,517,198.54**
සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම් අදාළ ක්ෂය වීම්	15	(26,345,242.48)	-	-	**(26,345,242.48)**
පූර්ව වර්ෂයේ ගැළපුම්	20	(470,000.00)	-	36,869.82	**(433,130.18)**
2015 වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම		-	-	(41,489,463.58)	**(41,489,463.58)**
2015.12.31 දිනට ශේෂය		**307,575,083.53**	**307,170,027.56**	**261,223,489.10**	**875,968,600.19**
2016.01.01 දිනට ශේෂය		307,575,083.53	307,170,027.56	261,223,489.10	**875,968,600.19**
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	17	102,406,369.70	-	-	**102,406,369.70**
සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම් අදාළ ක්ෂය වීම්	17	(29,560,267.97)	-	-	**(29,560,267.97)**
පූර්ව වර්ෂයේ ගැළපුම්	22	-	-	(23,575.77)	**(23,575.77)**
2016 වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම		-	-	46,483,631.27	**46,483,631.27**
2016.12.31 දිනට ශේෂය		**380,421,185.26**	**307,170,027.56**	**307,683,544.60**	**995,274,757.42**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	31/12/2016 රු.	31/12/2015 රු.
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ		
වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම	**46,483,631**	(36,313,714)
ගැළපුම්		
ක්ෂය වීම්	**29,560,268**	26,345,242
වර්ෂය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන	**8,841,796**	2,413,806
වෛද්‍යාධාර දායකත්වය සඳහා ප්‍රතිපාදන	**193,600**	173,968
පූර්ව වර්ෂ ගැළපුම්	**(23,576)**	36,870
	38,572,088	28,969,886
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	**85,055,719**	(7,343,828)
කාරක ප්‍රාග්ධනයේ සිදුවූ වෙනස්කම්		
ණය ගැතියෝ සහ වෙනත් ලැබීම් නියමිතවල වැඩිවීම / (අඩුවීම)	**59,026,630**	(90,669,514)
වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිතවල වැඩිවීම / (අඩුවීම)	**(16,871,644)**	(7,567,450)
වට්ටෝරු භාණ්ඩ වැඩිවීම / (අඩුවීම)	**22,165,039**	57,025,533
	64,320,025	(41,211,430)
පාරිතෝෂික ගෙවීමට පෙර මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**149,375,744**	(48,555,258)
අඩු කළා :		
ගෙවන ලද පාරිතෝෂික	**(576,705)**	(950,801)
වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම්	**(196,411)**	(73,642)
මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**148,602,628**	(49,579,701)
ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම	**(260,671,636)**	(39,913,120)
භාණ්ඩාගාර බිල්පත් අත්කර ගැනීම	-	(30,000,000)
මුදලින් පොලී ලැබීම්	**(2,389,439)**	(51,456)
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	**(263,061,075)**	(69,964,576)
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ		
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	**72,846,102**	166,005,984
මූල්‍ය කටයුතු වලින් ලද දළ මුදල් ප්‍රවාහ	**72,846,102**	166,005,984
මුදල් හා මුදල් සමාන දෑ වෙනස්වීම්	**(41,612,345)**	46,461,707
මුදල් හා මුදල් සමාන දෑ ඉදිරියට ගෙන එන ලදි	**53,922,992**	7,461,286
මුදල් හා මුදල් සමාන දෑ ඉදිරියට ගෙන යන ලදි	**12,310,647**	53,922,993
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති මුදල් සහ මුදල් සමාන දෑ හි විශ්ලේෂණය		
ලංකා බැංකුව, ජා-ඇල 71324617	**12,310,647**	53,922,992
	12,310,647	53,922,992

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

නිෂ්පාදන ගිණුම
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	31/12/2016 රු. ශත.	31/12/2015 රු.
නිෂ්පාදන පිරිවැය			
අමු ද්‍රව්‍ය			
2016.01.01 දිනට ශේෂය		**169,087,068.47**	218,004,588
මිලදී ගැනීම්		**1,156,412,060.53**	1,517,487,296
		1,325,499,129.00	1,735,491,884
2016.12.31 දිනට ශේෂය		**(151,509,362.88)**	(169,087,068)
පරිභෝජනය කළ අමුද්‍රව්‍යවල පිරිවැය		**1,173,989,766.12**	1,566,404,816
සෘජු ශ්‍රම පිරිවැය	**08**	**139,817,126.63**	132,557,414
කම්හල් පොදුකාර්ය වියදම්	**09**	**74,295,302.39**	90,556,367
ප්‍රති සැකසුම් අලාභය		**(199,118.65)**	(3,213,954)
මූලික පිරිවැය		**1,387,903,076.49**	1,786,304,643
නොනිමි වැඩ			
2016.01.01 දිනට ශේෂය		**9,025,425.56**	14,567,809
2016.12.31 දිනට ශේෂය	**13**	**(8,215,483.81)**	(9,025,426)
		809,941.75	5,542,384
මුලු නිෂ්පාදන පිරිවැය		**1,388,713,018.24**	1,791,847,026

1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1.1 වාර්තා කිරීමේ ආයතනය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්, පූර්ණ රජය සතු සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර පිහිටුවා ඇති, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන සීමිත වගකීමක් සහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, ජා ඇල, කපුවත්ත, තැ.පෙ. අංක 17 හි පිහිටා ඇත.

1.1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ''ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩසටහන'' සඳහා ''ත්‍රිපෝෂ'' නිෂ්පාදනය කරනු ලබන එකම සමාගම වනුයේ මෙම සමාගමයි.

සමාගමේ වෙනත් ප්‍රධාන කාර්යයන් වූයේ :

- ශ්‍රී ලංකාව තුළ මාතෘ සහ ළමා මන්දපෝෂණය අඩු කිරීම සඳහා ශක්ති වර්ධක ශ්‍රී ලාංකික අතිරේක ආහාර නිෂ්පාදිතයක් වන ''ත්‍රිපෝෂ'' වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය සහ බෙදා හැරීම පිණිස පහසුකම් සැලසීම.
- ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය සපයනු ලබන දේශීය ගොවීන් වෙත හැකිතාක් දුරට ආදායම් ජනනය වන මාර්ග සඳහා ධෛර්යමත් කිරීම.
- රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව, වෙනත් ආකාරයේ ශක්තිවර්ධක මිශ්‍ර කරන ලද ආහාර ද්‍රව්‍ය සඳහා පවතින වෙළඳපොළ අවම කිරීම.
- වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාව පිළිබඳව ඇගයීමක් සිදු කර, එය සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

1.1.3 අධ්‍යක්ෂ මණ්ඩලය

1. එම්. ඩී. බන්දුසේන මහතා (සභාපති)
2. වෛද්‍ය පාලිත ගුණරත්න මහීපාල මහතා
3. වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
4. එච්. එම්. තේජා හේරත් මහත්මිය
5. ඒ. ආර්. අහමඩ් මහත්මිය
6. වෛද්‍ය දමයන්ති හපුගොඩ මහත්මිය
7. බී. පී. චින්තක කුලරත්න මහතා
8. එස්. ආර්. රාජපක්ෂ මහතා (නිරීක්ෂක)

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

තනුජා ප්‍රියදර්ශනී අල්විස් මහත්මිය

1.1.4 විගණකවරුන්

විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

1.1.5 බැංකුකරුවන්

ලංකා බැංකුව, ජා ඇල.

1.1.6 නිකුත් කිරීම සඳහා බලයලත් දිනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවට අනුව, 2016 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම පිණිස අවසර ලබා දෙන ලදී.

1.1.7 සකස් කිරීමේ පදනම

අ. අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමඟ ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලවය.

ආ. නිර්ණය කිරීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණය කිරීම් සිදු කරනු ලබන අවස්ථාවන්හිදී හැර, මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත.

ඇ. සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන කාල සීමාව තුළ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමේ සහ අන්තර් කාල සීමා තුලනාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්, එම මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පෙර වර්ෂයේ සියලුම වටිනාකම් සම්බන්ධයෙන් ගුණාත්මක, විස්තරාත්මක සහ ව්‍යක්ත තොරතුරු ඇතුලත් සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කරනු ලැබේ.

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවකදී හැරුණු කොට, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාල සීමාවන් සඳහා අඛණ්ඩව අදාළ කරගනු ලැබ ඇත. මෙම මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත විෂයයන්හි ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය කිරීම සංශෝධනය කරනු ලැබ ඇති අවස්ථාවකදී, මනා ඉදිරිපත් කිරීමක් සිදු කිරීම පිණිස වත්මන් වර්ෂය හා අනුකූල වීම සඳහා සංසන්දනාත්මක වටිනාකම් ද නැවත වර්ගීකරණයට ලක් කරනු ලැබ ඇත.

ඈ. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ වලංගු මුදල

සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ වලංගු මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ.

වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවකදී හැරුණු කොට, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්න දහසට වටයනු ලැබ ඇත.

ඉ. ප්‍රධාන ඇස්තමේන්තු සහ වැදගත් තීන්දු භාවිත කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගත වූ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම මඟින් කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්හි වාර්තාගත වටිනාකම් කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ස්වරූපයේ තීන්දු ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ පූර්ව නිගමන වලට එළඹීම අපේක්ෂා කෙරේ. තථ්‍ය ප්‍රතිඵල, මෙම ඇස්තමේන්තු වලින් සහ යොදා ගන්නා ලද නිගමන වලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක කරගත් පූර්ව නිගමන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුව සංශෝධනය කරනු ලබන කාල සීමාව තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදු කරනු ලබන සංශෝධන හඳුනා ගනු ලබන්නේ, එම සංශෝධනය එම කාල සීමාව සඳහා පමණක් බලපාන්නේ නම් හෝ එකී සංශෝධනය වර්තමාන සහ අනාගත කාල සීමා දෙකටම බලපාන්නේ නම්, එම සංශෝධන කාල සීමාව සහ අනාගත කාල සීමාවන් තුළදීය.

ඊ. අඛණ්ඩ පැවැත්ම

නුදුරු අනාගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම නොකඩවා පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වෙමින්, ඒ අනුව, සමාගම ක්‍රියාත්මක තත්වයේ පවත්වාගෙන යාමේ උපකල්පනය නුදුරු අනාගත කාල සීමාව තුළ නොකඩවා යොදාගත හැකි බවට ද සහතික වෙයි.

1.2 වත්කම් සහ එම වත්කම් තක්සේරු කිරීමේ පදනම්

1.2.1 දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ

අ. හඳුනා ගැනීම සහ ඇගයීම

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද සාධාරණ අගය යටතේ හෝ වෙනත් යම් දුබලතා අලාභ යටතේ දක්වා ඇත.

සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් මූලික වශයෙන් සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද පිරිවැය යටතේ හෝ යම්දුබලතා අලාභ යටතේ වාර්තා කර ඇත. වත්කමක වැදගත් අංග හඳුනා ගෙන, වෙන වෙනම ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල වැදගත් අංග අන්තර් කාලය තුළ ආදේශ කරනු ලැබීමට අවශ්‍ය වන්නේ නම්, ආයතනය විසින් එම ආදේශ කළ කොටස බැහැර කරන අතර, නව කොටසෙහිම ප්‍රයෝජ්‍ය ජීව කාලය සහ ක්ෂය වීම් සමඟ එම කොටස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම අළුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය පැන නඟිනු ලබන පරිදි, ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ආ. පිරිවැය

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවල පිරිවැය, ඒවා මිලදී ගත් මිල සහ එයින් අපේක්ෂිත කාර්යය උදෙසා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම පිණිස ඍජුවම දරන ලද වෙනත් පිරිවැයෙන් සමන්විත වේ.

ඉපැයීමේ ධාරිතාව පවත්වාගෙන යාමේ හෝ ඉහළ නැංවීමේ අරමුණින්, ස්ථිර ස්වරූපයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන පසු කාලීන වියදම්, ප්‍රාග්ධන වියදම් සේ සලකනු ලැබ ඇත.

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ පරීක්ෂා කිරීමේ වියදම් ඇතුලත්, වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරනු ලබන දේපළක, පිරියතක සහ යන්ත්‍රෝපකරණයක එක් අංගයක් ආදේශ කිරීම සඳහා දරනු ලබන වියදම, ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. වෙනත් පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ, එම අංගයේ ඇතුලත් ඉදිරි ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ හැකියාවක් පවතී නම් සහ එහි පිරිවැය යථාර්ථවාදී ලෙස අගයනු ලැබිය හැකි නම් පමණි.

ඇ. ක්ෂය කිරීම්

වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය මත එම වත්කම්හි පිරිවැය ඉවත් කිරීම පිණිස, පහත සඳහන් වටිනාකම් යටතේ ඍජු රේඛීය පදනම (straight-line basis) මත වාර්ෂිකව, ප්‍රාග්ධන සංචිතය වෙත ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ.

ගොඩනැගිලි	අවුරුදු 20 ට වැඩි
පිරියත සහ යන්ත්‍රෝපකරණ	අවුරුදු 10 ට වැඩි
මෝටර් රථ	අවුරුදු 05 ට වැඩි
යන්ත්‍රෝපකරණ හා උපකරණ	අවුරුදු 05 ට වැඩි
විද්‍යාගාර උපකරණ	අවුරුදු 10 ට වැඩි
කෘෂිකාර්මික උපකරණ	අවුරුදු 10 ට වැඩි
විදුලි වැඩ	අවුරුදු 05 ට වැඩි
කාර්යාල උපකරණ	අවුරුදු 10 ට වැඩි
ලී බඩු සහ සවි කිරීම්	අවුරුදු 10 ට වැඩි
අස්පෘශ්‍ය වත්කම්	අවුරුදු 04 ට වැඩි

ඈ. හඳුනා නොගැනීම

බැහැර කරන විටදී හෝ භාවිතයෙන් කිසිදු ඉදිරි ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරනු ලබන අවස්ථාවකදී, දේපළක, පිරියතක සහ යන්ත්‍රෝපකරණයක අංගයක් හඳුනා නොගනු ලැබූ සේ සැලකේ. වත්කම් හඳුනා නොගැනීම මත හිමි වන ඕනෑම ලාභයක් හෝ පාඩුවක්, එම හඳුනා නොගැනීම සිදු කරනු ලබන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ඇතුලත් කරනු ලැබේ.

1.2.2 නොනිම් වැඩ

භාවිතයේ පවතින ප්‍රාග්ධනය පිරිවැයෙහි දක්වනු ලැබේ. මෙම වියදම්, ප්‍රාග්ධනීකරණය වීමට ඇති ගොඩනැගිලි ඉදි කිරීමේදී සෘජුවම හට ගන්නා ප්‍රාග්ධන ස්වරූපයක වියදම් වේ. භාවිතයේ පවතින ප්‍රාග්ධනය, භාවිතය සඳහා ලබා ගත හැකි අවස්ථාවේදී, අදාළ දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වත්කම් වර්ගීකරණයට මාරු කරනු ලැබේ. එනම්, සමාගම විසින් අපේක්ෂිත අයුරින් ඒ සඳහා ක්‍රියාත්මක වීමට හැකි ආකාරයෙන් එය පිහිටා ඇති අවස්ථාවේදී සහ අවශ්‍ය තත්ත්වයෙන් පවතින අවස්ථවේදීය. කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ, යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ණය ගැනුම් පිරිවැය ඇතුලත්ව, ගත් මිලට දක්වනු ලැබේ.

1.2.3 අස්පෘශ්‍ය වත්කම්

වත්කම වෙත ලැබෙන ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 අස්පෘශ්‍ය වත්කම්හි පරිදි වත්කමෙහි පිරිවැය යථාර්ථවාදී ලෙස ඇගයීමේ හැකියාවක් පවතී නම්, එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. ඒ අනුව, මෙම වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කර ගත් මිලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සඳහන් කරනු ලැබේ.

පරිගණක මෘදුකාංග වර්ෂ 4 ක කාල සීමාවක් පුරා සෘජු රේඛීය ක්‍රමය මත ක්‍රමක්ෂය කර ඇත.

වර්ෂ 5ක කාල සීමාවක් පුරා සෘජු රේඛීය ක්‍රමය මත විෂය මාලා පරිපාටි සංවර්ධනය කිරීමේ පිරිවැය ලියා අස්කර තිබේ.

1.2.4 භාණ්ඩ ලේඛන

කල් ඉකුත් වූ සහ අඩු ක්‍රියාකාරී අයිතම සඳහා නිසි ඉඩ ලබා දීමෙන් අනතුරුව, සාමාන්‍ය පිරිවැය යටතේ භාණ්ඩ ලේඛන ඇගයීම සිදු කරනු ලැබේ. ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන මිලයි.

භාණ්ඩ ලේඛන වත්මන් ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒමේදී දරනු ලබන පිරිවැය, පහත සඳහන් සූත්‍ර භාවිත කරමින් ගිණුම් ගත කරනු ලැබේ :-

අමු ද්‍රව්‍ය	-	ගත් මිලට
කෙරෙමින් පවතින වැඩ	-	ගත් මිලට
නිම කළ භාණ්ඩ සහ නිම නොවූ වැඩ	-	සෘජු ද්‍රව්‍ය සහ සෘජු ශ්‍රම පිරිවැය යටතේ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම්ව ස්ථිර නිෂ්පාදිතයේ යෝග්‍ය සමානුපාතිකයක් සඳහා වියදම් වෙන් කිරීම් සිදු කරනු ලබයි.
ගෙන යාමට නියමිත භාණ්ඩ	-	තථ්‍ය පිරිවැය යටතේ

ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන ඇස්තමේන්තු ගත විකුණුම් මිලයි.

1.2.5 වත්කම් දුබලතාවයට පත්වීම

දුබලතාවයට පත්වීම පිළිබඳ යම් සඳහනක් වේ දැයි නිර්ණය කිරීම සඳහා සෑම වාර්තා කරනු ලබන දිනකදීම වත්කම්හි ඉදිරියට ගෙනයන අගය සමාලෝචනය කරනු ලැබේ. එවැනි සඳහනක් වුවහොත්, නැවත ලබා ගත හැකි වත්කම් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. දුබලතාවයට අලාභයක් හඳුනා ගනු ලබන්නේ, යම් වත්කමක ඉදිරියට ගෙනයන අගය හෝ මුදල් ජනනය කිරීමේ ඒකකය, එහි නැවත ලබා ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම්ය. නැවත ලබා ගත හැකි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා භාවිත කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇත්නම්, දුබලතා අලාභය නැවත හරවාලනු ලැබේ.

1.2.6 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ පවත්නා මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු, කල් පිරීමට නියමිත ආයෝජන, විකිනීමට ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ අගයක් යටතේ වන මූල්‍ය වත්කම් ලෙස හෝ යෝග්‍ය පරිදි, ඵලදායී සීමාවක් තුළ සීමා කිරීමේ උපකරණ ලෙස සලකනු ලබන ව්‍යුත්පන්න ලෙස හෝ වර්ගීකරණය කරනු ලැබේ. සමාගම විසින් පළමු අවස්ථාවේදීම, සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය පිළිබඳව නිර්ණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම් අතිරික්තය යටතේ හඳුනාගනු ලබන්නේ, ගණුදෙණු පිරිවැය සඳහා ඍජුවම බලපෑම් කරනු ලබන, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් යටතේ වත්කම් නොවනු ලබන අවස්ථාවකදීය.

සමාගම විසින්, ඔවුන් සිය සමාගම ස්ථාපිත කළ දිනයේ සිට ණය, ලැබිය යුතු සහ තැන්පතු හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ දක්වා ඇති වත්කම් ඇතුලත්ව) මූලිකව හඳුනාගනු ලබන්නේ, වෙළඳ ගිවිසුමෙහි ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමාගම විසින් පාර්ශ්වකරුවකු වනු ලබන වෙළඳ දිනයේදී ය.

වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා ගිවිසුම්ගත අයිතින් කල් ඉකුත් වූ විට, සමාගම විසින් එම මූල්‍ය වත්කම බැහැර කරනු ලබන අතර, එමගින් මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීම උදෙසා, සාරානුකූලව මූල්‍ය වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දෙනු ලබන ගණුදෙණුවක් හරහා එම අයිතිය මාරු කරනු ලැබේ. සමාගම විසින් ඇති කරනු ලබන හෝ රඳවා තබා ගනු ලබන, පවරන ලද මූල්‍ය වත්කම්හි ඕනෑම පොලියක්, වෙන් වෙන් වශයෙන් වත්කමක් හෝ වගකීමක් සේ හඳුනා ගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ වගකීම් කපා හැරීමක් වන අතර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ එම දළ අගය ඉදිරිපත් කරනු ලබන්නේ, එම අගයන් කපා හැරීමට සමාගම සතුව නෛතික අයිතියක් පවතින විට සහ දළ පදනමක් මත නිරවුල් කිරීමට හෝ වත්කම අත්පත් කොට ගෙන, ඒ හා සමගාමීව වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පමණකි.

සමාගමේ මූල්‍ය වත්කම් තුළ මුදල්, කෙටි කාලීන ආයෝජන, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ.

අ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම් තුළ වෙළඳාම සඳහා දරන ලද මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත වර්ගීකරණයට ලක් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා දරන ලද්දේ යයි වර්ගීකරණය කරනු ලබන්නේ, ආසන්නතම කාල සීමාව තුළදී විකිණීමේ හෝ නැවත මිලදී ගැනීමේ අරමුණින්, එම වත්කම් අත්පත් කරගනු ලබන්නේ නම් ය.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූල්‍ය වත්කම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම තුළ හඳුනා ගනු ලබන සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් සමඟ සාධාරණ වටිනාකම යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ දක්වාලනු ලැබේ.

සමාගම විසින් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත කිසිදු මූල්‍ය වත්කමක් වර්ගීකරණය කර නොමැත.

ආ. ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු, ක්‍රියාකාරී වෙළඳපොළක් තුළ මතු කොට දක්වා නොමැති, ස්ථිර හෝ ලැබේ යයි සැලකිය හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ඇගයීමෙන් අනතුරුව, හා යන අඩු කර ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ පසුව අගයනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ, අත්පත් කරගැනීම මත ලද වට්ටම් හෝ වාරික සහ ඵලදායී පොලී අනුපාතයෙහි වැදගත් කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගැනීමෙනි. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ලැබිය යුතු වෙළඳ ආදායම්, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, වෙනත් ලැබිය යුතු සහ මුදල් සහ මුදල් සමාන දෑ ආදියෙන් ණය සහ ලැබිය යුතු ආදායම් සමන්විත වේ.

ඈ. කල් පිරීමට නියමිත ආයෝජන

ස්ථිර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරෙන තැන්පතු හා බැඳි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, සමාගම විසින් ධනාත්මක අදහසකින් පසු වන සහ කල් පිරෙන තෙක් ඒවා රඳවා තබා ගැනීමේ හැකියාව සමාගම සතු වූ විට, කල් පිරීමට නියමිත ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික ඇගයීමෙන් අනතුරුව, දුබලතා ඌණ ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි කල් පිරීමට නියමිත ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය යටතේ පසුව අගයනු ලැබේ. ඵලදායී පොලී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. රජයේ සුරැකුම් පත් සහ ස්ථිර තැන්පතුවල කරනු ලබන ආයෝජන, කල් පිරීමට නියමිත ආයෝජන යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇත.

ඇ. විකිණීමට හැකි මූල්‍ය ආයෝජන

විකිණීමට හැකි ලෙස හෝ ඉහත සඳහන් මූල්‍ය වත්කම් වර්ගීකරණ කිසිවක් තුළ වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, විකිනිමට හැකි මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, එම වත්කම් සාධාරණ වටිනාකම අනුව අගයනු ලබන අතර, දුබලතා අලාභ හැර වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගනු ලබන අතර, අරමුදල් සහ සංචිතවල තැන්පත් කර ඇති සාධාරණ වටිනාකමින් ඉදිරිපත් කරනු ලැබේ. විකිණීමට හැකි ණය සුරැකුම් මත පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් ගණනය කරනු ලබන අතර, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. යම් ආයෝජනයක් හඳුනා ගනු නොලැබූ විට, අරමුදල් හෝ සංචිත තුළ සමුච්චිත ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ ගිණුමෙහි නැවත වර්ගීකරණය කරනු ලැබේ.

මූලික හඳුනා ගැනීම මත, සමාගම විසින් කිසිදු මූල්‍ය වත්කමක් විකිණීමට හැකි ආයෝජනයක් ලෙස හඳුනා ගනු ලැබ නොමැත.

1.2.7 මූල්‍ය වත්කම් දුබලත්වයට පත්වීම

සමාගම විසින් සෑම වාර්තා කරනු ලබන දිනකදීම, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලත්වයට පත්වී ඇති බවට හරයාත්මක සාක්ෂි පවතිදැයි අගයනු ලබන අතර, එවැනි දුබලත්වයක් සිදු වී ඇත්නම්, එම දුබල වී ඇති ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ, වත්කම් දැරීමේ වටිනාකම සහ ඇස්තමේන්තු ගත ඉදිරි මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගනිමිනි.

1.2.8 මුදල් හා මුදල් සමානයන්

අතැති මුදල්, බැංකු තැන්පතු සහ නැවත මිලදී ගැනීමේ ගිවිසුම් යනාදියෙන් මුදල් සහ මුදල් සාම්‍යයන් සමන්විත වේ.

''සෘජු නොවන ක්‍රමවේදය'' භාවිතා කරමින් සකස් කරනු ලැබ ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් සහ මුදල් සාම්‍යයන්ගේ අංගයක් ලෙස බැංකු අයිරාව ඇතුලත් කරනු ලැබේ.

1.3 වගකීම් සහ වෙන්කිරීම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලබන වගකීම් වනුයේ, ඉල්ලීම මත හෝ වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයක් තුළ ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ය. වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයකට පසු ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ජංගම නොවන වගකීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී සියලුම වගකීම් සලකා බලනු ලැබේ. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සාධනීය වගකීමක් සමාගම සතුවන අවස්ථාවේදී, වෙන්කිරීම් සහ වගකීම් හඳුනා ගනු ලබන අතර, මෙම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇත.

1.3.1 සේවක ප්‍රතිලාභ

අ. විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ, සියලුම සුදුසුකම් ලත් සේවකයින් උදෙසා සමාගම විසින් ප්‍රතිලාභ සැලැස්මක් අදාළ කරගනු ලැබ ඇත. මෙම ප්‍රතිලාභ සැලැස්ම සඳහා බාහිර වශයෙන් අරමුදල් සපයනු නොලැබේ.

මෙම ප්‍රතිපාදන ගණනය කිරීමේදී භාවිතා කරනු ලබන මූලික පූර්ව නිගමන තුළ පහත දැක්වෙන කරුණු ඇතුලත් වේ :

වට්ටම් අනුපාතය	12%
ඉදිරි වැටුප් වැඩිවීම් අනුපාතය	10%
කාර්ය මණ්ඩල පිරිවැටුම	02%
විශ්‍රාම ගැනීමේ වයස	අවුරුදු 55

සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

ආ. නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්ම පශ්චාත් සේවා නියුක්ති සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් විසින් වෙනත් යම් ආයතනයක් වෙත ස්ථිර දායකත්වයක් ගෙවනු ලබන අතර, අමතර වටිනාකමක් ගෙවීම සඳහා ඊට කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් හිමි නොවනු ඇත. නිශ්චිත දායකත්ව සඳහා වන බැඳීම් වෙනුවෙන් වන දායකත්ව, විස්තිර්ණ ආදායම් ප්‍රකාශය තුළ හිඟ ලෙස පෙන්නුම් කෙරෙන පරිදි සහ ඒවා නියමිත වන්නා වූ අවස්ථාවන්හිදී එම ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

ඇ. සේවක අර්ථසාධක අරමුදල

එක් එක් සේවකයකුගේ වැටුප මත සමාගම සහ සේවකයා විසින් පිළිවෙළින්, 12% හා 8% බැගින් වන පරිදි, අනුමත කරන ලද අර්ථසාධක අරමුදල වෙත සිය දායකත්වය සලසා දෙනු ලැබේ.

ඇ. සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් විසින් එක් එක් සේවකයකුගේ වැටුප මත 3% ක් වූ ප්‍රමාණයක් අනුව සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත සිය දායකත්වය සලසා දෙනු ලැබේ.

1.3.2 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ගත් මිල මත සඳහන් කරනු ලැබේ.

1.3.3 බදුකරණය

ලාභාංශ හෝ පොලී වලින් ලද අතිරික්තය සහ ආදායම් හැර, සමාගමේ අතිරික්තය සහ ආදායම්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 7 (ixiv) වගන්තිය යටතේ ආදායම් බදු වලින් නිදහස් කෙරේ.

1.3.4 කල් තබන ලද බදුකරණය

සමාගමේ අතිරික්තය සහ ආදායම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 7 (ixiv) වගන්තිය යටතේ ආදායම් බදු වලින් නිදහස් කර ඇති හෙයින්, විලම්බිත බදු සඳහා විධිවිධාන සකස් කර නොමැත.

1.3.5 ප්‍රාග්ධන වගකීම් හා අවිනිශ්චිත වගකීම්

අවිනිශ්චිත වගකීම් යනු, ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදු කළ නොහැකි හෝ නිසියාකාරව ගණනය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම් වලින් පමණක් පැවැත්ම සහතික කරනු ලැබිය හැකි වගකීම්ය.

මූල්‍ය ප්‍රකාශවලට සිදු කරන අදාළ සටහන්හි සමාගමේ ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම් අනාවරණය කරනු ලැබේ.

1.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

ප්‍රාග්ධන සංචිතය (ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළව)

වර්ෂ 2011 සිට සෞඛ්‍ය අමාත්‍යාංශය, කෙයා (CARE) ආයතනය සහ ශ්‍රී ලංකා දුම්කොළ සමාගම විසින් ස්ථිර වත්කම් මත වැය කරන ලද අරමුදල්, ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සලකනු ලැබ ඇති අතර, ඒ අනුව, වර්ෂය සඳහා සමස්ත ක්ෂය කිරීම් සඳහා හිලව් කිරීම සිදු කරමින්, මෙම විෂයන්ට අදාළ ක්ෂය කිරීම් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වලට ඇතුලත් කරනු ලැබ ඇත.

1.4.1 ප්‍රදාන

යම් ප්‍රදානයක් ලැබෙන බවට සහ ඊට යා කොට ඇති කොන්දේසි හා අනුගත වනු ඇති බවට සාධාරණ සහතිකවීමක් පවතින අවස්ථාවකදී රජයේ ප්‍රදාන හඳුනා ගනු ලැබේ.

සමාගම තුළ ඇති කෙරෙනු ලබන වියදම් වෙනුවෙන් ඒ වෙත පිරිනමනු ලබන ප්‍රදාන, එම වියදම් හඳුනා ගනු ලබන වර්ෂයේම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ. යම් වත්කමක පිරිවැය සඳහා සමාගම වෙත ලබා දෙනු ලබන ප්‍රදාන, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

1.4.2 වියදම්

අ. ජනනය වූ පිරිවැය සහ සුවිශේෂී ආදායම් වර්ග ඉපැයීම් අතර සෘජු සබඳතාව මත පදනම්ව, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගනු ලැබේ. සමාගමෙහි මෙහෙයුම් කටයුතුවලදී සහ කාර්යක්ෂම අවස්ථාවන්හිදී ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේදී ඇති වන සියලුම වියදම්, එම වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේදී ආදායම්හි ප්‍රතිපාර්ශ්වීය ලෙස අය කරගනු ලැබ ඇත.

1.4.3 මූල්‍ය වියදම් /ආදායම්

ආයෝජනය කරන ලද අරමුදල් සඳහා උපචිත පදනම මත ලද පොලියෙන් මූල්‍ය ආදායම සමන්විත වේ.

1.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හා අනුගතව සකස් කරනු ලැබ ඇත.

1.6 වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේ සිදුවීම්

වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසුව මූල්‍ය ප්‍රකාශ තුළ ගැළපුම් හෝ අණාවරණ අවශ්‍ය වන්නාවූ සැලකිය යුතු සිදුවීම් කිසිවක් නොමැත.

1.7 නිකුත් කරන ලද, එහෙත් තවමත් ක්‍රියාත්මකභාවයේ නොමැති ප්‍රමිතීන්

සමාගමෙහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශ නිකුත් කළ දින දක්වා නිකුත් කරන ලද, එහෙත් තවමත් ක්‍රියාත්මකභාවයේ නොමැති ප්‍රමිතීන් පහත දැක්වේ. නිකුත් කරන ලද ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණ ලේඛනය යනු, ඉදිරි දිනකදී අදාළ කරගනු ලබන අවස්ථාවකදී අනාවරණය කිරීම්, මූල්‍ය තත්ත්වය හෝ කාර්ය සාධනය මත බලපෑමක් ඇති කෙරෙනු ඇති බවට සමාගම විසින් සාධාරණතාව අපේක්ෂා කරනු ලබන ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණ වේ. මෙම ප්‍රමිතීන් බලාත්මක වනු ලබන අවස්ථාවේදී, එම ප්‍රමිතීන් අදාළ කරගනු ලැබීමට සමාගම විසින් අපේක්ෂා කරනු ලබයි.

අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 09 මූල්‍ය උපකරණ :

වර්ගීකරණය සහ ගණනය කිරීමේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ආදේශ වනු ලබන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 හි අර්ථ නිරූපිත මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ ගණනය කිරීම සඳහා අදාළ කරගනු ලැබේ. මෙම ප්‍රමිතියෙහි අනිවාර්ය බලාත්මක දිනය කල් තබා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 09හි පළමු අදියර අදාළ කරගැනීම මගින්

සමාගමෙහි මූල්‍ය වත්කම්වල වර්ගීකරණය සහ ගණනය කිරීම මත බලපෑමක් ඇති කරනු ලබන නමුත්, වාස්තවිකව මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ ගණනය කිරීම මත කිසිදු බලපෑමක් ඇති නොකරනු ලැබේ. විස්තරාත්මක ඉදිරිපත් කිරීමක් ඉදිරිපත් කිරීම පිණිස, නිකුත් කරනු ලැබූ විට, සමාගම විසින් අනෙකුත් අදියරයන් හා එක්ව ගෙන එහි බලපෑම ගණනය කරනු ලැබේ.

1.8 විකිණීම සඳහා තබා ගන්නා ලද ජංගම නොවන වත්කම්

නිරන්තර භාවිතය හරහා නොව මූලිකව, බැහැර කිරීම මඟින් නැවත ලබා ගැනීමට අපේක්ෂිත ජංගම නොවන වත්කම්, විකිණීම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. විකුණුම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කිරීමට වහාම ප්‍රථම, සමාගමෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගතව මෙම වත්කම් නැවත ගණනය කරනු ලැබේ. ඉන් පසුව, එම වත්කම්හි වටිනාකමට අඩු වටිනාකම සහ විකුණුම් පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම යටතේ එම වත්කම් ගණනය කරනු ලැබේ. විකිණීම සඳහා තබා ගන්නා ලද, මූලික වර්ගීකරණය කිරීම මත හායන පාඩු සහ නැවත ගණනය කිරීම මත ලද පසු කාලීන ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. කිනම් හෝ සමුච්චිත හායන පාඩුවක් ඉක්මවා ලැබීම් හඳුනා ගනු නොලැබේ.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	31/12/2016	31/12/2015
	රු. ශත.	රු.
02. <u>ආදායම</u>		
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම	**1,467,564,568.46**	1,776,421,903
අයභාරය	**1,738,004.43**	-
	1,469,302,572.89	1,776,421,903
03. <u>පරිභෝජනයට සූදානම් නිෂ්පාදනවල පිරිවැය</u>		
2016.01.01 දිනට නිමවූ නිෂ්පාදන	**38,202,137.04**	39,550,478
මුළු නිෂ්පාදන පිරිවැය	**1,388,713,018.24**	1,791,847,026
2016.12.31 දිනට නිමවූ නිෂ්පාදන	**(34,050,017.76)**	(38,202,137)
	1,392,865,137.52	1,793,195,367
04. <u>වෙනත් ආදායම්</u>		
අපනයන විකුණුම්	**11,831,512.85**	20,815,957
නිවාස ණය මත පොලී	**1,086,085.45**	1,364,375
භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම්	**6,793,074.20**	3,599,383
	19,710,672.50	25,779,714
05. <u>බෙදාහැරීමේ පිරිවැය</u>		
ප්‍රවාහන වියදම	**6,929,064.13**	11,119,781
	6,929,064.13	11,119,781
06. <u>පරිපාලන වියදම්</u>		
මූලික වැටුප	**5,982,697.97**	8,008,393
සේවක අර්ථසාධක අරමුදල	**1,076,557.71**	1,084,434
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	**289,807.71**	271,107
අතිකාල දීමනා	**708,400.40**	964,761
දීමනා	**6,567,819.63**	4,477,972
ගමන් වියදම්	-	3,971,580
නෛතික හා වෘත්තීය ගාස්තු	-	684,566
කාර්යමණ්ඩල සුබසාධනය	**2,151,417.37**	1,521,857
ගොඩනැඟිලි අළුත්වැඩියා හා නඩත්තු	**11,841,776.54**	2,918,953
උද්‍යාන නඩත්තුව	**70,635.00**	70,305
කාර්යාල උපකරණ නඩත්තු	**729,127.71**	862,566
දුරකථන ගාස්තු	**584,150.59**	222,156
ආරක්ෂක ගාස්තු	**7,034,082.85**	6,932,193
වාහන අළුත්වැඩියාව	**2,154,767.81**	-
මෝටර් වාහන ඉන්ධන	**120,424.90**	-
ලිපි ද්‍රව්‍ය	**674,101.94**	1,162,744
තැපැල් ගාස්තු	**239,625.00**	434,596
අපනයන වියදම්	**127,570.82**	803,393
බලපත්‍ර හා රක්ෂණ ගාස්තු	**1,152,696.46**	-
දිරි දීමනා	**1,003,892.04**	1,037,630
කාර්යමණ්ඩල පුහුණු කිරීමේ ගාස්තු	-	344,400
සනිපාරක්ෂක සහ වෙනත්	-	330,295
	42,509,552.45	36,103,901

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	31/12/2016	31/12/2015
	රු. ශත.	රු.
07. මූල්‍ය හා වෙනත් වියදම්		
බැංකු ගාස්තු	**26,741.37**	58,077
නැවත සකස්කිරීමේ අලාභය	**199,118.65**	3,213,954
	225,860.02	3,272,031
08. සෘජු ශ්‍රම සහ කළමනාකරණ පිරිවැය		
කර්මාන්ත ශාලා වැටුප් සහ වේතන		
මූලික වැටුප	**35,923,672.45**	59,093,740
සේවක අර්ථසාධක අරමුදල	**6,534,397.58**	7,006,976
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	**1,772,604.29**	1,751,742
අතිකාල දීමනා	**19,830,216.47**	19,945,224
විශේෂ දීමනාව	**43,774,460.50**	25,402,271
පාරිතෝෂික	**8,841,795.50**	2,413,806
සම්මන්ත්‍රණ සංග්‍රහ වියදම්	**3,462,466.34**	3,150,166
වෛද්‍ය සේවා ප්‍රතිගෙවුම්	**102,786.66**	742,153
සේවා පර්යන්ත ගෙවීම්	**30,347.49**	-
දිරි දීමනා	**6,004,187.00**	6,002,713
වැටුප් හා වේතන	**3,035,168.15**	2,060,041
වෙනත් ගිවිසුම්	**6,707,893.78**	835,939
නිල ඇඳුම් සහ සේදුම් වියදම්	**3,797,130.42**	4,152,642
	139,817,126.63	132,557,414
09. කම්හල් පොදු කාර්ය පිරිවැය		
විදුලි බොයිලේරුව සහ විදුලි ජනක ඉන්ධන	**51,081,727.80**	58,598,387
කම්හල් නඩත්තු ගාස්තු	**2,001,871.96**	1,821,128
පිරියත හා යන්ත්‍රෝපකරණ නඩත්තු	**17,772,373.55**	24,184,401
වෙනත් සේවා	**1,662,564.71**	2,663,747
වරිපනම් සහ බදු	**445,036.47**	486,969
නියැදි පරීක්ෂාව	**792,803.90**	1,498,088
පළිබෝධ පාලනය	**538,924.00**	970,412
දුරකථන	**-**	333,234
	74,295,302.39	90,556,367

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

10. දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය / ප්‍රත්‍යාගණනය	2016.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	මාරු කිරීම්	2016.12.31 දිනට ශේෂය
ඉඩම්	220,000,000.00	-	-	**220,000,000.00**
ගොඩනැගිලි	76,764,082.06	33,422,843.80	-	**110,186,925.86**
පිරියත හා උපකරණ	157,822,457.20	218,900,546.35	-	**376,723,003.55**
මෝටර් රථ	22,208,750.00	-	-	**22,208,750.00**
උපකරණ හා අම්පන්න	11,929,912.97	1,696,411.56	-	**13,626,324.53**
විද්‍යාගාර උපකරණ	5,702,187.50	280,224.50	-	**5,982,412.00**
කෘෂිකාර්මික උපකරණ	138,650.00	-	-	**138,650.00**
විදුලි වැඩ	2,448,650.81	3,710,383.95	-	**6,159,034.76**
කාර්යාල උපකරණ	12,304,126.62	2,234,509.47	-	**14,538,636.09**
ගෘහ භාණ්ඩ හා උපාංග	4,334,851.29	426,716.38	-	**4,761,567.67**
	513,653,668.45	260,671,636.01	-	**774,325,304.46**

සමුච්චිත ක්ෂය කිරීම්	2016.01.01 දිනට ශේෂය	වර්ෂය සඳහා අය	මාරු කිරීම්	2016.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි	11,614,074.97	3,838,204.10	-	**15,452,279.07**
පිරියත හා උපකරණ	44,369,164.15	15,785,871.72	-	**60,155,035.87**
මෝටර් රථ	7,838,042.17	4,441,750.00	-	**12,279,792.17**
උපකරණ හා අම්පන්න	6,976,002.26	2,499,427.82	-	**9,475,430.08**
විද්‍යාගාර උපකරණ	1,624,971.19	584,742.01	-	**2,209,713.20**
කෘෂිකාර්මික උපකරණ	43,905.83	13,865.00	-	**57,770.83**
විදුලි වැඩ	1,049,925.29	520,890.92	-	**1,570,816.21**
කාර්යාල උපකරණ	3,047,942.67	1,264,878.21	-	**4,312,820.88**
ගෘහ භාණ්ඩ හා උපාංග	1,171,605.63	445,341.30	-	**1,616,946.93**
	77,735,634.16	29,394,971.08	-	**107,130,605.24**

ලියා අඩු කළ අගයන්	2016.12.31 දිනට ශේෂය	2015.12.31 දිනට ශේෂය
	රු. ශත.	රු.
ඉඩම්	**220,000,000.00**	220,000,000
ගොඩනැගිලි	**94,734,646.79**	65,150,007
පිරියත හා උපකරණ	**316,567,967.68**	113,453,293
මෝටර් රථ	**9,928,957.83**	14,370,708
උපකරණ හා අම්පන්න	**4,150,894.45**	4,953,911
විද්‍යාගාර උපකරණ	**3,772,698.80**	4,077,216
කෘෂිකාර්මික උපකරණ	**80,879.17**	94,744
විදුලි වැඩ	**4,588,218.55**	1,398,726
කාර්යාල උපකරණ	**10,225,815.21**	9,256,184
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	**3,144,620.74**	3,163,246
	667,194,699.22	435,918,034

11. අස්පෘෂ්‍ය වත්කම්

	2016.12.31 දිනට ශේෂය රු. ශත.	2015.12.31 දිනට ශේෂය රු.
පිරිවැය	**661,187.57**	661,188
සමුච්චිත ක්ෂය කිරීම්	**(165,296.89)**	-
ලියා අඩු කළ අගය	**495,890.68**	661,188

12. ආයෝජන

	2016.12.31 දිනට ශේෂය රු. ශත.	2015.12.31 දිනට ශේෂය රු.
භාණ්ඩාගාර බිල්පත් - මුහුණත් වටිනාකම	**92,359,000.00**	90,000,000
ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම	**282,169.64**	251,731
	92,641,169.64	90,251,731

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

13 වට්ටෝරු භාණ්ඩ	31/12/2016	31/12/2015
	රු. ශත.	රු.
අමු ද්‍රව්‍ය		
බඩඉරිඟු	18,732,378.06	8,632,731
සෝයා	93,212,872.80	91,069,823
ඛනිජ ලවණ	114,540.00	2,545,452
විටමින්	2,549,808.75	3,684,368
කිරි පිටි	31,833,000.00	55,451,250
	146,442,599.61	161,383,623
ඇසුරුම් අමුද්‍රව්‍ය		
පොලිතින් බෑග්	2,890,755.00	4,081,248
මල්ටි ලේයර් පොලිතින් රිල්	1,029,346.95	3,237,161
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	934,950.00	385,037
ට්වයින් නූල්	211,711.32	-
	5,066,763.27	7,703,445
වෙනත්		
ඩීසල්	2,248,175.00	1,586,975
ඉංජිනේරු ගබඩා	10,085,039.15	10,371,512
	12,333,214.15	11,958,487
නොනිම් වැඩ		
අමු ද්‍රව්‍ය		
බඩඉරිඟු	5,259,870.00	4,402,760
සෝයා	1,533,410.00	3,023,085
ඛනිජ ලවණ	186,127.50	48,951
කිරි පිටි	627,750.00	465,000
විටමින්	96,479.25	51,893
ඇසුරුම් අමුද්‍රව්‍ය		
පොලිතින් බෑග්	171,085.50	179,387
මල්ටි ලේයර් පොලිතින් රිල්	263,231.32	792,895
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	72,302.80	61,455
ට්වයින් නූල්	5,227.44	-
	8,215,483.81	9,025,426
නිමි භාණ්ඩ		
මාතෘ	11,936,657.70	13,206,554
ළමා	22,113,360.06	24,995,583
	34,050,017.76	38,202,137
එකතුව	206,108,078.60	228,273,118

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	31/12/2016	31/12/2015
	රු. ශත.	රු.
14 වෙළඳ හා වෙනත් ලැබීම්		
ණයකරුවන්	**50,945,138.11**	1,627,719
නිවාස ණය - වත්කම් ණය ගිණුම	**10,848,129.62**	17,877,066
නිවාස ණය - ආපදා ණය ගිණුම	**9,403,574.67**	10,972,102
විනෝද චාරිකා අත්තිකාරම්	**147,500.00**	233,000
විවිධ තැන්පතු සහ පූර්ව ගෙවීම්	**3,087,658.20**	102,748,743
තැන්පතු	**101,000.00**	101,000
ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල්	**987,500.00**	987,500
	75,520,500.60	134,547,131
15 මුදල් හා මුදල් සමාන දෑ		
ලංකා බැංකුව, ජා ඇල 71324617	**12,310,647.40**	53,922,992
	12,310,647.40	53,922,992

16 ප්‍රකාශිත ප්‍රාග්ධනය

අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තිරණයක ප්‍රතිඵලයක් ලෙස, ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරිත්වය, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සම්පූර්ණ රජය සතු පොදු සීමිත සමාගමක් වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව, රු. 304,600,000/= ක (රුපියල් තුන් මිලියන හයසිය දහසක්) ප්‍රකාශිත ප්‍රාග්ධනය සහිතව 2010 සැප්තැම්බර් මස 17 වන දින ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

	31/12/2016	31/12/2015
17 ප්‍රාග්ධන සංචිත		
වර්ෂය මුල ශේෂය	**307,575,083.51**	136,873,127
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	**102,406,369.70**	39,251,932
ප්‍රාග්ධන වත්කම් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද අත්තිකාරම්	-	158,265,266
ස්ථාවර වත්කම් ව්‍යපහරණ අලාභය	-	(470,000)
අඩු කළා : වර්ෂය සඳහා ක්ෂය කිරීම් ගාස්තු	**(29,560,267.97)**	(26,345,242)
වර්ෂ අවසානයේ ශේෂය	**380,421,185.24**	307,575,084
18 ප්‍රත්‍යාගණන සංචිත		
වර්ෂය මුල ශේෂය	**307,170,027.56**	307,170,028
වර්ෂය තුළ ප්‍රත්‍යාගණනය	-	-
වර්ෂය අවසානයේ ශේෂය	**307,170,027.56**	307,170,028
19 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		
වර්ෂය මුල ශේෂය	**29,593,685.00**	28,130,680
අඩු කළා : වර්ෂය තුළ ගෙවීම්	**(576,705.00)**	(977,538)
වර්ෂය සඳහා ප්‍රතිපාදන	**8,841,795.50**	2,440,543
වර්ෂය අවසානයේ ශේෂය	**37,858,775.50**	29,593,685

වට්ටම් ගත අනුපාතය	**12%**	12%
ඉදිරි වැටුප් වර්ධක අනුපාතය	**10%**	10%
කාර්ය මණ්ඩල පිරිවැටුම්	**2%**	2%
විශ්‍රාම ගැනිමේ වයස	අවුරුදු 55	අවුරුදු 55

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	31/12/2016	31/12/2015
	රු. ශත.	රු.
20 වෛද්‍යාධාර අරමුදල		
වර්ෂය මුල ශේෂය	**241,489.96**	141,164
වර්ෂය තුළ දායකවීම්	**193,600.00**	173,968
වර්ෂය තුළ ගෙවීම්	**(196,411.06)**	(73,642)
වර්ෂය අවසානයේ ශේෂය	**238,678.90**	241,490

21 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු.

ණය හිමියන්	**20,573,379.34**	37,381,448
උත්සව අත්තිකාරම්	**36,250.00**	-
ආපසු ගෙවනු ලබන තැන්පතු	**179,337.50**	179,338
ගෙවිය යුතු විගණක පාරිශ්‍රමික	**109,807.50**	209,633
	20,898,774.34	37,770,418

22 පූර්ව වර්ෂ ගැළපුම්

ගෙවිය යුතු ගිණුම්වලට අදාළ ගැළපුම්	-	36,870
වියදම් ගිණුමට අදාළ ගැළපුම්	23,575.77	-
2014 දී යන්ත්‍රෝපකරණ ව්‍යාපහරණය මත අලාභය	-	(470,000)
	23,575.77	(433,130)

23 ප්‍රාග්ධන ප්‍රදාන හා සම්බන්ධ ක්ෂය කිරීම්

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කර ඇති ස්ථාවර වත්කම්වලට අදාළ ක්ෂය කිරීම්, එම වර්ෂයේ මුළු ක්ෂය කිරීමේ ගාස්තු අඩු කරමින් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට අයගත කරගනු ලැබ ඇත.

24 බැඳියා සහ අවිනිශ්චිතතා

- වාර්තා කරනු ලබන දිනයේදී කිසිදු සැලකිය යුතු බැඳියාවක් හෝ අවිනිශ්චිතතාවක් නොපැවතුණි.

25 සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්

ප්‍රධාන පෙළේ කාර්යමණ්ඩල සාමාජිකයින් හා පවත්නා ගනුදෙනු

සමාගමෙහි ප්‍රධාන පෙළේ කාර්යමණ්ඩල සාමාජිකයින් වනුයේ, එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ ය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No. } එච්එස්එම්/එෆ්/එස්එල්ටිසී/06/16/12

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2017 අගෝස්තු 18 දින

සභාපති

සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ නිෂ්පාදන ගිණුම, ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන්වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 සමාගම පිහිටුවීම

1987 වර්ෂයේ සිට ලංකා දුම්කොළ සමාගම යටතේ පැවති ත්‍රිපෝෂ ව්‍යාපෘතිය, 2010 ජූනි 23 දිනැති අංක 10/1236/415/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම ලෙස පූර්ණ රජයේ කොටස් ප්‍රාග්ධනයක් සහිතව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2010 සැප්තැම්බර් 14 දින ලියාපදිංචි කර තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02

පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග ආගණනය කළ යුතු වුවද ත්‍රිපෝෂ නිමි තොග සාමාන්‍ය පිරිවැය මත ආගණනය කර තිබුණි. තවද සෘජු අමුද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය හා සෘජු ස්ථාවර පොදු කාර්යය පිරිවැය ඇතුළත්ව අවසන් නොනිමි තොග වටිනාකම ගණනය කළ යුතු වුවද, සෘජු අමුද්‍රව්‍ය පිරිවැය පමණක් ඇතුළත් කර නොනිමි තොග වටිනාකම රු.8,215,484 ක් ලෙස ආගණනය කර තිබීම හේතුවෙන් වර්ෂයේ නිෂ්පාදන පිරිවැය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

සමාගම ගෙවනු ලබන පාරිතෝෂික විශ්‍රාම ප්‍රතිලාභ පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය (Projected unit Credit method) අනුව ආයුගණක තක්සේරුකරුවෙකුගේ (Actuarial valuator) උපදෙස් මත වර්තමාන වටිනාකමට ගණනය කළ යුතුය. එහෙත් ඊට අනුකූල නොවන පරිදි සමාගම විසින් පාරිතෝෂික විශ්‍රාම ප්‍රතිලාභ ගණනය කර 2016 දෙසැම්බර් 31 දිනට එය රු.37,858,775 ක් ලෙස දක්වා තිබූ අතර ගිණුම්කරණ ප්‍රතිපත්තියද හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20

වත්කමක් සඳහා වන රජයේ ප්‍රදානයක් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ විලම්බිත ආදායම් (deferred income) නමින් දිගුකාලින වගකීම් යටතේ හෝ පවරාගත් වත්කමේ වටිනාකම (carrying amount) පෙන්වීමේදී අඩුකර හෝ දැක්විය යුතුය. සමාගම වෙත වත්කම් අත්පත්කර ගැනීම සඳහා ඉකුත් වර්ෂවලදී ලැබී තිබුණු නමුත් අගය නිශ්චය කළ නොහැකි හා සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.106,019,410 ක් වූ ප්‍රදාන යටතේ මිලදී ගත් වත්කම්වලට අදාළ ක්ෂය ආදායම් වියදම් ගිණුමට ගැලපීම හා විලම්භිත ආදායමක් ලෙස ක්‍රමක්ෂය කිරීම වෙනුවට ප්‍රාග්ධන ප්‍රදානවලින් අඩුකර දක්වා තිබුණි. තවද මූල්‍ය ප්‍රකාශනවල ප්‍රදාන සම්බන්ධයෙන් සිදු කර තිබූ හෙළිදරව් කිරීම් පැහැදිලිව ඉදිරිපත් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමෙහි සාංගමික සංස්ථාවලියෙහි 6 වන උප වගන්තිය අනුව, සමාගමේ සියළුම කොටස් ප්‍රාග්ධනය රජය වෙනුවෙන් භාණ්ඩාගාරයේ ලේකම් විසින් දැරිය යුතු අතර එහි 7 වන උප වගන්තියට අනුව සමාගමේ කොටස් ප්‍රාග්ධනය රු.මිලියන 304.6 ක් විය යුතු බව දක්වා තිබුණද එවැනි ප්‍රාග්ධන හිමිකමක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගෙන තිබුණු සෝයා කිලෝග්‍රෑම් 1,509 ක් හානිවීම නිසා තොග පොත්වලින් කපාහැර තිබුණු නමුත් හානිවූ තොගයේ වටිනාකම ගණනය කර ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සමග සිදුකරන ගනුදෙනු සඳහා පවත්වා තිබුණු වැය ලෙජරයේ හා වැය ලෙජර් සාරාංශයේ සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව පවත්වා තිබුණු ලෙජරයේ ගිණුම්වල නම් හා අගයන් එකිනෙකට සමාන නොවන අවස්ථා 15 ක් විය. ඉන් ලෙජර් ගිණුම් වටිනාකම සඳහන් නොවූ අවස්ථා 8 ක් වූ අතර අවස්ථා 7 කට අදාළ ලෙජර් ගිණුම් වටිනාකම රු. 2,483,465 ක් වූ බව නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ඉතිරි අමුද්‍රව්‍ය, නොනිමි හා නිමි තොග ආගණනය කිරීමේ ක්‍රියාවලියට විගණකාධිපතිවරයාට ආරාධනා නොකිරීම හේතුවෙන් එම ක්‍රියාවලියට විගණකාධිපතිවරයාගේ නියෝජිතයින් සම්බන්ධ නොවිය. මේ අනුව විගණනයේ විෂය පථය සීමා වී තිබීම හේතුවෙන් එදිනට පිරිවැය රු.206,668,618 ක් වූ ඉතිරි තොග සම්බන්ධයෙන් අදහසක් ඉදිරිපත් කළ නොහැකි විය.

(ආ) විගණනය වෙත වාර්තා කර තිබුණු පරිදි සමාලෝචිත වර්ෂයේදී සමාගමේ නිලධාරීන් තිදෙනෙකු විදේශ සංචාර සඳහා සහභාගී කරවා ඒ වෙනුවෙන් රු.1,224,119 ක් වැයකර තිබුණු නමුත් එම විදේශ සංචාර සම්බන්ධයෙන් වූ ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම ගමන් නීති රීති රෙගුලාසිවලට අනුකූලද යන්න හා සංචාරයේ අරමුණු ඉටුවී තිබුණේද යන්න පිළිබඳව අදහසක් ඉදිරිපත් කළ නොහැකි විය.

(ඇ) ජර්නල් වවුචර පිළියෙල කිරීමකින් තොරව ජර්නල් සටහන් යොදා ලෙජර ගිණුම්වල ගැලපීම් සිදුකර තිබුණු අතර එකතුව රු.1,193,313,232 ක්වූ එම ගැලපීම්වලට අදාළ ආධාරක ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 110	හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 139(6)	මුදල් රෙගුලාසි ප්‍රකාරව, මුදල් ගෙවීමට පෙර චෙක්පතේ දැක්වෙන ආදායකයාගේ නම වවුචරයේ මතුපිට දක්වා ඇති විස්තර සමග ගැලපෙන බව තහවුරු කර ගත යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂය තුළදී මුළු එකතුව රු.30,000 ක් ගෙවීම සඳහා නිකුත් කර තිබුණු චෙක්පත් 02 කට අදාළ ගෙවීම් වවුචර්වල සඳහන් නම වෙනුවට වෙනත් නම් චෙක් පිළිපත්වල හා මුදල් පොතේ සටහන් කර තිබුණි.
(iii) මුදල් රෙගුලාසි 751	ලැබෙන සියලුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොත්වල ඇතුළත් කළ යුතු වුවත් ඒ සඳහා බඩු ලේඛන පොත් පවත්වා නොතිබුණි.
(iv) මුදල් රෙගුලාසි 756 හා 757	සෑම වර්ෂයක් සඳහාම භාණ්ඩ සමීක්ෂණයක් සිදු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 880 සහ 881

ඇප තැබීමට අවශ්‍ය සිය යටත් නිලධාරීන් නියමිත කාලසීමාව ඇතුළත එසේ ක්‍රියා කරන බවට සමාගමේ ප්‍රධානීන් වග බලා ගත යුතුය. එහෙත් ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන් 06 දෙනෙකුගෙන් ඇප ලබා ගෙන නොතිබුණි.

(vi) මුදල් රෙගුලාසි 1647

ආයතනය සතු පිරිවැය රු.22,208,750 ක් වූ වාහන 07 ක් පැවතියද වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 3.8 ඡේදය

අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නිලධාරීන්ට දැනුම්දීම හා පසුවිපරම් කිරීම සිදු කර නොතිබුණි.

(ii) 4.3 ඡේදය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන්, එවැනි රැස්වීම් පැවැත්වීමේ ඊළඟ දිනය ස්ථිර වූ පසු දින 10 ක් ඇතුළත රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කළ බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(iii) 9.2 (ඈ) ඡේදය

සමාගමේ සංවිධාන සටහන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිකර නොතිබුණි.

(ඇ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මාසිකව ඉන්ධන ලීටර් 170 කට සමාන ඉන්ධන දීමනා නිකුත් කිරීම වෙනුවට 2015 නොවැම්බර් සිට 2017 මාර්තු 17 දක්වා කාලය තුළදී රු.419,447 ක් වටිනා ඉන්ධන ලීටර් 3,277 ක් නිලවාහනයකට අනුමත සීමාව ඉක්මවා නිකුත් කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.46,483,631 ක වියදම ඉක්මවූ ආදායමක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම රු.41,489,464 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.87,973,095 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම් ප්‍රතිපූර්ණය සඳහා ලැබීම්වලින් නිෂ්පාදන පිරිවැය අඩුකිරීමෙන් පසුව වූ දායකය රු. 93,210,899 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කාර්යසාධනය

සමාගම් සංස්ථාවලියට අනුව මාතෘ සහ ළමා මන්දපෝෂණය අවම කිරීම සඳහා ශ්‍රී ලංකාවේ භාවිතා වන අතිරේක පෝෂ්‍ය පදාර්ථයක් වන ත්‍රිපෝෂ නිෂ්පාදනය, බෙදාහැරීම සහ ඊට අදාළ කටයුතු ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සැලසීම, ත්‍රිපෝෂ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීමේ නියුක්ත දේශීය ගොවියාගේ ආදායම් ප්‍රවර්ධනය කිරීමේ මාර්ග සඳහා ඔවුන් දිරිමත් කිරීම, රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලවන වෙනත් අනුමත පෝෂ්‍ය පදාර්ථයන් නිපදවීම සහ අලෙවිකරණය, දේශීය වශයෙන් වාර්ෂිකව අවශ්‍ය කරන ත්‍රිපෝෂ ප්‍රමාණය පිළිබඳව තක්සේරුකර එම අවශ්‍යතාවය සැපයීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සමාගමේ ප්‍රධාන අරමුණු විය.

අළුතින් මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර සවිකිරීම සඳහා කර්මාන්ත ශාලාව මාසයක් වසා තැබීමට සිදුවී තිබීම හා නව යන්ත්‍ර ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය සේවක පුරප්පාඩු පුරවා නොතිබීම මෙන්ම නව ඇසුරුම් යන්ත්‍ර නියමිත වේලාවට සපයා ගෙන නොතිබීම ආදී වූ හේතූන් මත මාස දෙකක කාලයක් නිෂ්පාදන කාර්යය අඩුවෙන් සිදුකර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ නිෂ්පාදන සැලැස්ම හා සැසඳීමේදී සියයට 47 ක් වූ ත්‍රිපෝෂ මාස්ටර් බෑග් 379,430 ක නිෂ්පාදන ඉලක්කයක් ලබා කර ගැනීමට නොහැකි වී තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ පරිපාලන කටයුතු සඳහා පරිපාලන රීති සංග්‍රහයක් පිළියෙල කර තිබුණු නමුත්, මෙම වාර්තාවේ දින වන විටත් ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සමාගමේ පරිපාලන අංශයේ නිලධාරීන් වෙනුවෙන් රාජකාරී ලැයිස්තු පිළියෙළ කර ගොනු ගත කර තිබුණ නමුත් එම රාජකාරී ලැයිස්තු එම නිලධාරීන් වෙත ලිඛිතව භාරදී නොතිබුණි. තවද ගිණුම් අංශයේ නිලධාරීන් වෙත රාජකාරී ලැයිස්තු ලබාදී තිබුණු නමුත් ඔවුන් ඉටුකරනු ලබන රාජකාරී ඇතුළත්වන පරිදි රාජකාරී ලැයිස්තු සංශෝධනය කර නොතිබුණි.

(ඇ) සමාගම පිහිටි ඉඩම සඳහා නීත්‍යානුකූල ඔප්පුවක් නොතිබුණු බැවින් ප්‍රකාශන ඔප්පුවක් පිළියෙල කිරීමට තීරණයකර තිබුණද, මෙම වාර්තාවේ දිනය වන විටත් එය පිළියෙල කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) සෝයා බෝංචි හා බඩ ඉරිඟු සඳහා පවත්වා ගෙන යනු ලබන අමුද්‍රව්‍ය ගබඩාව තුළ සතුන්ගෙන් සිදු වන හානි වළක්වා ගැනීමට ආරක්ෂක විධිවිධාන අනුගමනය කළ යුතුය. එහෙත් සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී ගබඩාවේ ඉහලින් පිහිටි කවුළු සමහරක් විවෘතව තිබුණු බවද, ගබඩාවේ දොර ආවරණය කර තිබුණු දැලෙහි කොටසක් විවෘතව තිබුණු බව හා ගබඩාව තුළ පරවියන් සිටි බවද නිරීක්ෂණය විය.

(ඉ) මීයන් විසින් කා දමා තිබීම හා දූමකරණයෙන් අපවිත්‍රවීම නිසා හානිවී තිබුණු වටිනාකම නිශ්චිතව හඳුනා නොගත් එහෙත් දළ වටිනාකම රු.62,470 ක් පමණ වූ සෝයා කිලෝග්‍රෑම් 98 ක් හා බඩ ඉරිඟු කිලෝග්‍රෑම් 857 ක් 2017 මාර්තු 15 දින වන විට නිෂ්පාදනය සඳහා සුදුසු සෝයා බෝංචි හා බඩ ඉරිඟු සමඟ එකට ගබඩා කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන හානිවූ තොගය විනාශ කිරීමටත්, තොග පොත්වලින් ඉවත් කිරීමටත් හා එහි වටිනාකම ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කර

නොතිබුණි. එමෙන්ම අලාභය පිළිබඳව හා ගබඩා නියමිත ප්‍රමිතීන් අනුව පවත්වා නොගැනීමට අදාළව වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ අංක 05 වගන්තිය ප්‍රකාරව, සේවය අවසන් වූ දින සිට දින 30 ක් ඇතුළත සේවය අවසන් වූ නිලධාරීන්ට හිමි පාරිතෝෂික මුදල් ගෙවිය යුතු වුවද, 2016 ජූලි 15 හා 2016 නොවැම්බර් 21 යන දින දෙකෙහිදී විශ්‍රාම ගෙන තිබුණු නිලධාරීන් දෙදෙනෙකු වෙත මෙම වාර්තාවේ දිනය වන විටත් විශ්‍රාම පාරිතෝෂික ගෙවා නොතිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

බේරුවල මැතිවරණ කොට්ඨාශයේ සංවිධානය කර තිබූ අවුරුදු උත්සවයක තරඟ සඳහා ත්‍යාග වශයෙන් ලබා දීමට යෝජිත භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් පුද්ගලික ආයතනයක් වෙත රු.50,000 ක් වටිනා චෙක්පතක් නිකුත් කර තිබුණද අවුරුදු උත්සවයක් පැවැත්වූයේ ද යන්න පිළිබඳව සනාථ කිරීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. තවද විගණනයේ දී සිදුකරන ලද පරීක්ෂාවට අනුව චෙක්පත නිකුත් කරනු ලැබූ ආයතනය එවැනි භාණ්ඩ අලෙවි කරන ආයතනයක් නොවන බව නිරීක්ෂණය වූ අතර ගෙවීම් වවුචරයේ, චෙක් පිළිපතේ හා මුදල් පොතේ බැංකු සනාථ අනුව දක්වා තිබූ ගෙවීම් ලාභියාගේ නම එකිනෙකට පරස්පර වී තිබුණි.

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ත්‍රිපෝෂ සමාගමට අයත් ගබඩාවේ ඉහළ මාලයේ වර්ග අඩි 900 ක ඉඩ ප්‍රමාණයක් උපයෝජනයට ගෙන නොතිබුණු අතර භාවිතයට ගත හැකි එහෙත් භාවිතයට නොගන්නා වටිනාකම රු.25,480 ක් පමණ වූ ඇසුරුම් මේස 13 ක් හා භාවිතයට ගත නොහැකි පුටු 04 ක් හා බංකු 13 ක් ද පැවතුණි.

(ආ) පොත් අගය රු.2,192,286 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 203 ක් වර්ෂ කිහිපයක සිට භාවිතයට ගත නොහැකිව පවතින නමුත් ඒවා විධිමත් පරිදි අපහරණය කිරීමට හා

පොත්වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඊට අමතරව ලෝක ආහාර සංවිධානය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණු වාහනයක් 2011 වර්ෂයේදී සමාගමට ලබාදී තිබුණද එය මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණු බැවින් ධාවනය කළ නොහැකිව සමාගම් පරිශ්‍රයේ පිහිටි ගරාජයක නවතා තිබුණි.

4.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය හා සංශෝධිත පරිපූරක 28 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව රු. මිලියන 200 ට වැඩි ප්‍රසම්පාදනයන් අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවක් විසින් සිදු කළ යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂයේ රු.757,170,000 ක්වූ බඩ ඉරිඟු අවශ්‍යතාවය අවස්ථා කිහිපයකට වෙන්කර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රසම්පාදනය සිදුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ඛණිජ ද්‍රව්‍ය අවශ්‍යතාවය සපයා ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2016 මැයි 18 දින ආරම්භකර එතැන් පටන් මාස 09 ක් ගතකර තිබුණු නමුත් එම කටයුතු අවසන් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් නිෂ්පාදනය සඳහා හදිසි අවශ්‍යතාවය වූ ඛණිජ ද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 82 ක් ඉකුත් වර්ෂයේ ඛණිජ ද්‍රව්‍ය අවශ්‍යතාවය සපයා ගැනීම සඳහා තෝරා ගෙන තිබුණු සැපයුම්කරු වෙතින් මිලදී ගැනීමට සිදුවී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි අවසන් කර සැපයුම්කරු තෝරා නොගැනීම හේතුවෙන් වැඩි මුදලකට පැරණි සැපයුම්කරුගෙන් මිලදී ගැනීමට සිදුවීම නිසා සමාගමට රු.13,612,000 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා විටමින් අවශ්‍යතාවය සපයා ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු නියමිත පරිදි අවසන් කර අවම මිල ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරු වෙතින් වාර්ෂික අවශ්‍යතාවය වූ කිලෝ ග්‍රෑම් 22,000 ක් කිලෝ ග්‍රෑම් එකක් රු.2,384 ක් බැගින් මිලට නොගැනීම හේතුවෙන් කිලෝග්‍රෑම් එකක් රු.2,397ක් බැගින් මිලට ගැනීමට සිදුවීම නිසා රු.286,000 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා මුද්‍රිත පොලිතීන් රෝල් අවශ්‍යතාවය සපයා ගැනීමේ, ප්‍රසම්පාදන කටයුතු 2016 මැයි 16 දින ආරම්භ කර තිබූ අතර කිලෝවක් සඳහා රු.410 ක අවම මිල ඉදිරිපත් කර තිබූ සැපයුම්කරු ප්‍රසම්පාදන කොන්දේසියක් කඩකර තිබීම හේතුවෙන් ප්‍රතික්ෂේප වී තිබුණි. ඒ අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් දෙවැනි අවම මිල ඉදිරිපත් කල සැපයුම්කරු වෙතින් පළමු අවම මිලට පොලිතීන් මිලදී ගැනීමට නිර්දේශ කර තිබුණි. එහෙත් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ද නොසළකා දෙවන ප්‍රසම්පාදන කටයුතු අළුතින් ආරම්භ කර තිබූ අතර පුවත්පත් දැන්වීම සඳහා රු.56,055 ක් වැයකර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සිදුවී තිබුණු මන්දගාමී බව හේතුවෙන් හදිසි අවශ්‍යතාවය සඳහා මුද්‍රිත පොලිතීන් රෝල් කිලෝග්‍රෑම් 25,000 ක් අවස්ථා 2 කදී ඉකුත් වර්ෂයේ තෝරා ගෙන තිබුණු සැපයුම්කරු වෙතින් කිලෝවක් රු.418 බැගින් මිලදී ගැනීම හේතුවෙන් සමාගමට එකතුව රු.200,000 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 ඡේදයෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, තාක්ෂණික පිරිවිතරයන්ගේ ප්‍රධාන ප්‍රතිපාදනවලට ලංසුකරුගේ අනුකූලතාවය පෙන්නුම් කරන සංසන්දනාත්මක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, එකතුව රු.224,562,000 ක් වූ අමු ද්‍රව්‍ය වර්ග දෙකක් හා ඇසුරුම් ද්‍රව්‍ය වර්ග දෙකක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනවලදී එවැනි වාර්තාවක් පිළියෙල නොකර තාක්ෂණික ඇගයීම සිදුකර තිබුණි.

(ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) ප්‍රකාරව විෂය පිළිබඳ විශේෂඥයෙකුගෙන් සහ ප්‍රසම්පාදන කාර්යය පරිපාටිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති අවම වශයෙන් එක් සාමාජිකයෙකුගෙන්ද තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත යුතු වුවත්, පිරිවැය රු.98,006,000 ක් වූ විටමින් හා ඛණිජ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා පත්කර තිබුණු තාක්ෂණික ඇගයීම් කමිටු එවැනි සංයුතියකින් සමන්විතවී නොතිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරක් වූ ගිණුම් නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කර ගැනීමෙන් තොරව 2015 වර්ෂයේදී නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි.

(ආ) සමාගමේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරක් නොවූ සම්බන්ධීකරණ නිලධාරී තනතුර සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 06 දෙනෙකු 2015 ඔක්තෝබර් සිට 2017 පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය තුළ කොන්ත්‍රාත් පදනම මත සමාගම විසින් බඳවා ගෙන තිබුණි. එසේම මෙම නිලධාරීන් 06 දෙනා සමාගමේ සේවය සඳහා වාර්තා කර නොතිබුණු අතර 2017 පෙබරවාරි 28 දින වන විට එකතුව රු.2,553,000 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව සමාගමේ ශේෂපත්‍ර දිනෙන් පසුව මාස 06 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශ සම්පූර්ණ කර ඇති බවට හා සහතික කර ඇති බවට අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් වගබලා ගත යුතු වුවද 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් එම විධිවිධාන අනුගමනය කර නොතිබුණි. තවද 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1ඡේදය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාවද සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවද මෙම වාර්තාවේ දිනය දක්වාම ඉදිරිපත් කර නොතිබුණි.

5.2 සංයුක්ත සැලැස්ම

2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ වර්ෂ 05 වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණු නමුත්, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපතක් චක්‍රලේඛය ප්‍රකාරව අදාල ආයතන වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් ක්‍රියාකාරකම සඳහා සැලසුම් කළ කාලපරිච්ඡේදය තුළ ඉටුකර ගතයුතු අරමුණු, ඉලක්ක, කළමනාකාරීත්වයේ වගකීම් හා භෞතික ඉලක්කයන් පැහැදිලිව හා සෘජුව දක්වා නොතිබුණු අතර මූල්‍යමය ඉලක්ක පමණක් දක්වා තිබුණි. තවද කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සැලසුම් කළ ආකාරය ක්‍රියාකාරමක් ලෙස හඳුනාගෙන නොතිබුණු අතර කාලපරිච්ඡේදයට අදාළ උපායමාර්ගික සැලැස්මට විස්තරාත්මක තොරතුරු වෙනුවට ප්‍රාග්ධන වියදම් වර්ගීකරණයක් පමණක් දක්වා තිබුණි.

5.4 අභ්‍යන්තර විගණනය

සමාගමේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක මූල්‍ය හා කාර්යසාධන විගණනයක් සිදු කිරීමට ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර පත්කර තිබුණු අභ්‍යන්තර විගණන නිලධාරියා විගණන කටයුතු සිදුකරන අතරතුර ගිණුම් නිවැරදි කිරීමේ කටයුතුවලද නිරතවී තිබුණි. එම නිලධාරියා විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය විගණනය පමණක් සිදුකර තිබුණි.

5.5 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව 2017 වර්ෂයේ පළමු හා දෙවන කාර්තු සඳහා පැවැත්විය යුතු විගණන කමිටු රැස්වීම 2017 ජූලි 19 දින වන විටත් පවත්වා නොතිබුණි.

5.6 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 4.2.1 ඡේදවල දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කර නොතිබුණි.

5.7 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන්වී දින 150 ක් තුළදී 2015 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු නමුත් මෙම වාර්තාවේ දින වන විටත් සභාගතකර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු ය.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	ස්ථාවර වත්කම් කළමනාකරණය	භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කර පොත්වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම.
(ආ)	ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල වන ලෙස මිලදී ගැනීම් සිදු නොකිරීම.
(ඇ)	කාර්ය මණ්ඩල පරිපාලනය	බඳවා ගැනීම් පරිපාටි පිළියෙල කර අනුමත කරවා ගැනීමකින් තොරව තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කර තිබීම හා අනුමත කාර්ය මණ්ඩලයේ නොපවතින තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර තිබීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති.